# පුරවැසි අධ්‍යාපනය

## 6 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

(2015 සිට ක්‍රියාත්මක වේ)



සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# පුරවැසි අධ්‍යාපනය

## ගුරු මාර්ගෝපදේශය
## 6 වන ශ්‍රේණිය

**(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

පුරවැසි අධ්‍යාපනය
6 වන ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2014

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN ..............

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිතව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හයවන සහ දහවන ශ්‍රේණි සඳහා හඳුන්වාදීම කළ යුතුව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනාවන් ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලුම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූලව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනාදී අංශයන් සඳහා අවශ්‍යවන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන්ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එමනිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමීව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම තුළින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලුම සම්පත්දායකයින් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවයෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රම වේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයෙහි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙ හි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාට ද දෙගුරුනට ද භාවිත කළ හැකිය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළ පොත හා ගුරු මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## උපදේශකත්වය හා අනුමැතිය

**ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය**

## සම්බන්ධීකරණය

| | |
|---|---|
| ඒ.එල්.එස්. අබේවික්‍රම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

## ලේඛක මණ්ඩලය (බාහිර)

| | |
|---|---|
| සී.එස් ජයසිංහ | ගුරු මධ්‍යස්ථාන කළමනාකරු (විශ්‍රාමික), හොරණ |
| කේ.ඒ.එන්. පුෂ්පකුමාර | ගුරු සේවය<br>පොලේගොඩ ම.වි, මහගම |
| පී.ඩී. සෝමාවතී | ගුරු උපදේශිකා (විශ්‍රාමික)<br>බුලත්සිංහල |
| පී.පී. මාලිකා | ගුරු උපදේශිකා<br>හම්බන්තොට |
| එම්.කේ කිංස්ලි ප්‍රියන්ත | කථිකාචාර්ය<br>රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, වලහන්දුව, ගාල්ල |
| එම්.ඒ.ඒ.පී. මල්ලවආරච්චි | ගුරු උපදේශක<br>නිකවැරටිය |
| ජේ.එම්.එම් ජයසුන්දර | ගුරු උපදේශක<br>නිකවැරටිය |
| එම්.එච්.එම්. යාකුත් | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය |

## ලේඛක මණ්ඩලය (අභ්‍යන්තර)

| | |
|---|---|
| ඒ.එල්.එස්. අබේවික්‍රම | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| එස්.යූ.අයි.කේ ද සිල්වා | කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| එස්. කරුණාකරන් | කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

## විෂය විශේෂඥ සහය

| | |
|---|---|
| ආචාර්ය ශාමින්ද වනසිංහ | කථිකාචාර්ය<br>අධ්‍යාපන පීඨය<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ |
| නීතිඥ වසන්තා සෙනෙවිරත්න | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>පොදු හා අන්තර්ජාතික නීති අධ්‍යයන අංශය<br>නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |
| නීතිඥ මෙලනි පලිහක්කාර | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති නිලධාරි<br>මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය<br>නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය |

## භාෂා සංස්කරණය

| | |
|---|---|
| එච්.පී. සුසිල් සිරිසේන | කථිකාචාර්ය<br>හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, මීරිගම |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

2007 වර්ෂයේ සිට 6 - 9 ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක වූ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂය කොටස් දෙකකින් සමන්විත විය. ඒ අනුව I කොටස ජීවන නිපුණතා නමින් ද II කොටස පුරවැසි අධ්‍යාපනය නමින් ද හැඳින්විය.

මෙම විෂය පාසල් මට්ටමෙන් ක්‍රියාත්මක වීමේ දී මෙසේ විෂය කොටස් දෙකක් ලෙස පැවතීම ඉගෙනුම් , ඉගැන්වීම් ඇගයීම් ක්‍රියාවලියේ 'දී ප්‍රායෝගික වශයෙන් ගැටලු ඇති වීමට හේතු විය. මේ සම්බන්ධයෙන් විෂය ප්‍රවීණයන්. ගුරු උපදේශකවරුන්, ගුරුවරුන් මෙන් ම සිසුන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් හා පර්යේෂණ අනාවරණයන් හි ප්‍රතිඵල සැලකිල්ලට ගෙන පුරවැසි අධ්‍යාපනය නමින් තනි විෂයක් ලෙස 2015 සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මෙහි දී 6 - 9 ශ්‍රේණිවල ඇතුළත් ව තිබූ ජීවන නිපුණතා විෂයයේ හා පුරවැසි අධ්‍යාපනය විෂයයේ ඇතුළත් විෂය අන්තර්ගතයන් හි සමානකම් සැලකිල්ලට ගෙන යෝග්‍ය පරිදි එක් විෂයක් ලෙස නව විෂයයේ අන්තර්ගතය සකස් කර ඇත. ඒ අනුව ඉගෙනුම්, ඉගැන්වීම්, ඇගයීම් ක්‍රියාවලිය වඩාත් පහසුවන ආකාරයටත්, විෂය අරමුණු ඉටුවන ආකාරයටත් ඉදිරිපත් කර ඇත.

මේ අනුව 2015 සිට ක්‍රියාත්මක වන පුරවැසි අධ්‍යාපනය විෂයය 6 - 11 දක්වා ම තනි විෂයක් ලෙස ක්‍රියාත්මක වේ. එහි දී 6 - 9 ශ්‍රේණි සඳහා සතියට කාල පරිච්ඡේද දෙකක් ද, 10 -11 ශ්‍රේණි සඳහා කාල පරිච්ඡේද තුනක් ද වෙන් කර ඇත.

6 වන ශ්‍රේණියට අදාළ මෙම පුරවැසි අධ්‍යාපනය ගුරු අත්පොත පරිශීලනය කිරීමේ දී එක් එක් නිපුණතාවට, නිපුණතා මට්ටමට අදාළ ව ඉදිරිපත් කර ඇති ඉගෙනුම් පල සාක්ෂාත් කරගත හැකි පරිදි ඉගෙනුම් ක්‍රියාවලිය සිදු කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය පාඩම් සැලසුම් සකස් කිරීමේ දී ආවරණය කළ යුතු විෂය කරුණු අවශ්‍ය උදාහරණ සහිත ව දක්වා ඇත. ගුරු අත්පොත භාවිතයට ගැනීමේ දී එක් එක් මතෘකාවට සමගාමී ව පෙළ පොතෙහි ඇතුළත් කර ඇති කරුණු හා ක්‍රියාකරකම් ද සැළකිල්ලට ගෙන කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙහි ඇතුළත් කර ඇති ගුණාත්මක යෙදවුම් උදාහරණ වන අතර අවශ්‍ය පරිදි ඒවා වෙනස් කර ගැනීමේ නිදහස තිබේ.

මෙම විෂයයෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමේ දී මෙහි ඇතුළත් විෂය අන්තර්ගතය අර්ථාන්විත ව අධ්‍යයනය කිරීමට ඉඩ සලසා දීම ගුරු කාර්යභාරය සම්බන්ධයෙන් ඉතා වැදගත් වේ. මෙහි දී 2007 වර්ෂයේ නිකුත් කරන ලද 6 වන ශ්‍රේණියේ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ද භාවිතා කළ හැකි ය.

අවම වශයෙන් 50% ක් වත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් විෂය කරුණු ආවරණය කිරීම කෙරෙහි ගුරුභවතාගේ අවධානය යොමු කරන මෙන් කාරුණික ව ඉල්ලා සිටිමු. මෙම ගුරු මාර්ගෝපදේශය සම්බන්ධ සංවර්ධනාත්මක යෝජනා වෙතොත් අප වෙත යොමු කරන මෙන් ද කාරුණික ව ඉල්ලා සිටිමු.

ව්‍යාපෘති කමිටුව

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | vii |
| විෂය නිර්දේශය අන්තර්ගතය | viii-xxxv |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 01-34 |
| 6.1 අපේ පාසල | 01-16 |
| 6.2 අප ජීවත්වන ප්‍රදේශය | 17-24 |
| 6.3 යහපත් පුරවැසියෙකු වශයෙන් ප්‍රගුණ කළ යුතු ගුණාංග | 25-34 |
| විවිධ සහාය | 35 |

# පුරවැසි අධ්‍යාපනය

## විෂය නිර්දේශය

## 6 ශ්‍රේණිය

**(2015 සිට ක්‍රියාත්මක වේ)**

# හැඳින්වීම

1999 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා අනුව 2000 වර්ෂයේ සිට 7,8,9 ශ්‍රේණි සඳහා ජීවන නිපුණතා විෂයය ප්‍රථම වරට විෂයමාලාවට හඳුන්වා දෙන ලදී.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවේ යෝජනා අනුව 2005 වර්ෂයේ සිට ඉතිහාසය හා සමාජ අධ්‍යයනය විෂයය වෙනුවට 6-11 ශ්‍රේණි සඳහා පුරවැසි අධ්‍යාපනය, භූගෝල විද්‍යාව හා ඉතිහාසය යන විෂයයන් හඳුන්වා දෙනු ලැබීය. ඒ වන විට ජීවන නිපුණතා විෂයය ද 7-9 ශ්‍රේණිවල ක්‍රියාත්මක විය.

2007 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය විෂයය කොටස් ඒකාබද්ධ කර 6-9 ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක විය. 10-11 ශ්‍රේණි සඳහා පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය නමින් විෂයයේ නම වෙනස් කරන ලදී.

මේ අනුව 6-9 ශ්‍රේණිවල දී I කොටස ලෙස ජීවන නිපුණතා විෂයය ද II කොටස ලෙස පුරවැසි අධ්‍යාපනය විෂයය ද ක්‍රියාත්මක විය.

මෙසේ ක්‍රියාත්මක වීමේ දී ඇති වූ ප්‍රායෝගික ගැටලු හා ඒ වන විට කර තිබූ පර්යේෂණ අනාවරණ, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්ගේ අදහස් ආදිය ද සලකා විෂය කොටස් දෙකක් වෙනුවට තනි විෂයයක් ලෙස ක්‍රියාත්මක කිරීම වඩාත් ඵලදායි බව හැඟෙන්නට විය.

6-9 ශ්‍රේණි සඳහා මෙම විෂයය කොටස් දෙකක් ලෙස ක්‍රියාත්මක වීම වෙනුවට විෂයය කොටස් දෙකේ අන්තර්ගතයේ සමානකම් සැලකිල්ලට ගෙන එක් විෂයයක් ලෙස ඒකාබද්ධ කර ක්‍රියාත්මක කිරීම වඩාත් යෝග්‍ය බැවින් විෂය නිර්දේශ නවීකරණය කිරීමේ දී එක් විෂයයක් ලෙස ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි විෂය නිර්දේශය නැවත සකස් කරන ලදී.

මේ අනුව ජීවන නිපුණතා කොටසේ තිබූ විෂය කොටස්, අවශ්‍යතාව සලකා වඩාත් යෝග්‍ය පරිදි පුරවැසි අධ්‍යාපනය විෂය කොටස සමග ඒකාබද්ධ කරන ලදී

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

I වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලි කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

(ii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(iii) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

ඳ: (V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින්හට ශක්තිය ලබා දීම.

# පුරවැසි අධ්‍යාපනය 6-11 ශ්‍රේණි විෂය අරමුණු

01. තම හැකියා දක්ෂතා විභව්‍යතා හඳුනා ගනිමින් අනාගත ජීවන ඉලක්ක ගොඩනගා ගැනීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

02. මනා පෞරුෂයකින් යුතු ව සමාජයේ ජීවත් වීමට අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම

03. සමාජයේ යහපැවැත්මට දායක වන සමාජ සංවිධාන හා සංස්ථා සමග එකමුතු ව කටයුතු කිරීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

04. නිරතුරු ව වෙනස්වන ලෝකයේ අනපේක්ෂිත හා ව්‍යාකූල අවස්ථාවන්ට සාර්ථක ව මුහුණදීමට අවශ්‍ය ශක්තීන් වර්ධනය කිරීම

05. බහුවිධ සමාජයක් තුළ එක්සත්බවින් යුක්ත ව ජීවත් වීමට අවශ්‍ය මානව ගුණාංග හා සමාජ සාරධර්මවලින් යුක්ත පුරවැසියන් බිහි කිරීම

06. ප්‍රජාතන්ත්‍රවාදී මුලධර්මවලට හා මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තීන්ට අනුගත ව කටයුතු කරන සමාජයක් ගොඩනැගීම

07. අපදා කළමනාකරණයට සක්‍රීයව දායක වෙමින් ආපදා අවස්ථාවලින් වැළකීම හා සිදුවන හානි අවම කර ගැනීම

08. දේශපාලන සංකල්ප, ඒවායේ ප්‍රායෝගික භාවිත සහ ශ්‍රී ලංකාවේ හා ලෝකයේ පාලන රටා පිළිබඳ අවබෝධය ලබා දීම

09. විවිධ ආර්ථීක න්‍යායන් හා විවිධ ආර්ථීක මූලධර්ම විමර්ශනය කිරීම හා ඒවා සමාජ ජීවිතයට යෝග්‍ය පරිදි අදාළ කර ගැනීම

10. අන්‍යෝන්‍ය වශයෙන් වගකීම් හා යුතුකම් අගයන සමාජයක් ගොඩනැගීම

11. ශ්‍රී ලංකාවට තිරසර සාමයක් ළඟා කර ගැනීම

12. දැරිය හැකි ජීවන රටාවක් ගොඩනගා ගැනීම තුළින් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයක් ඇති කිරීම

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **අපේ පාසල**<br>6.1<br>ක්‍රියාශීලී සාමාජිකයෙකු වශයෙන් පාසල් සමාජයේ සංවර්ධනයට දායක වෙයි. | 6.1.1<br>පාසලේ ආරම්භය හා විකාශනය විමර්ශනය කරයි | • ආරම්භක පසුබිම<br>* ආරම්භ කිරීමට මුල් වූ හේතු<br>* ආරම්භ වූ ආකාරය<br>* ආරම්භ කිරීමට මැදිහත් වූ පුද්ගලයින්<br>* ප්‍රථමයෙන් ආරම්භ කළ ස්ථානය<br>* පාසල ආරම්භ කරන කාලයේ ගමේ/නගරයේ පසුබිම<br>• සමාජ ආර්ථික කටයුතු<br>• ජීවනෝපාය මාර්ග<br>* පාසලෙන් බිහි වූ දීප්තිමත් ආදි සිසුන් | •පාසලේ ආරම්භය පිළිබඳ මූලික තොරතුරු පැහැදිලි කරයි<br>•පාසල ආරම්භ කිරීමට මුල් වූ පුද්ගලයින්ගේ සේවය අගය කරමින් අදහස් දක්වයි<br>•පාසල ආරම්භ වූ අවධියේ ගමේ/ නගරයේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි<br>•පාසලෙන් සිදුවන සේවය අගය කරමින් අදහස් දක්වයි | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.1.2<br>පාසලේ සංවිධාන ව්‍යුහය විමර්ශනය කරයි | • පාසලේ සංවිධාන ව්‍යූහය<br>• පාසලේ සංවිධාන ව්‍යූහයේ විවිධ භූමිකා හා නිලතලවලට අයත් වගකීම් හා යුතුකම්<br>• විවිධ නිලතල දරන පුද්ගලයන් තම වගකීම් හා යුතුකම් ඉටු කිරීමෙන් පාසලේ සාර්ථකත්වයට ඇති කරන බලපෑම<br>• සෑම සාමාජිකයෙකු ම පාසල් සංවිධාන ව්‍යූහයේ කොටස් කරුවෙකු වන බව | • පාසලේ සංවිධාන ව්‍යුහය දළ සැළැස්මක් මගින් නිරූපණය කරයි.<br>• පාසලේ විවිධ භූමිකා නිරූපණය කරන අය තම යුතුකම් ඉටු කිරීම පාසලේ ඵලදායීතාව කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරයි.<br>• පාසලේ කාර්ය සාධනයෙහිලා සෑම සාමාජිකයෙකුගේ ම සක්‍රීය දායකත්වය තිබිය යුතු බව පිළිගනිමින් අදහස් දක්වයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- | --- |
| | 6.1.3<br>පාසල් සමාජයේ සාමාජිකයෙකු ලෙස තමා පිළිබඳ ව තොරතුරුවල අවශ්‍යතාව විමසා බලයි | • තම අනන්‍යතාව<br>* තමන්ගේ නම හා වයස<br>* ලිපිනය<br>* පාසලට ඇතුළත් වූ දිනය හා ඇතුළත් වීමේ අංකය<br>• තමන් සතු හොඳ ගති ලක්ෂණ<br>• තමන්ගේ දක්ෂතා<br>* ඒවා වැඩි දියුණු කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග<br>• තම දුර්වලතා<br>* ඒවා අවම කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග<br>• තමන්ට ඇති බාධා<br>* එම බාධා ජය ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග<br>• තමාගේ සංවර්ධනය සඳහා පාසලෙන් ලැබෙන අවස්ථා | • පාසල තුළ තම අනන්‍යතාව ගොඩනගා ගැනීමට ආධාරවන තොරතුරු සපයයි.<br>• තමා සතු හොඳ ලක්ෂණ හඳුනාගෙන ඒවා වර්ධනය කර ගැනීමට කටයුතු කරයි.<br>• තම දුර්වලතා හඳුනාගෙන ඒවා අවම කර ගැනීමට කටයුතු කරයි.<br>• තමන්ට ඇති බාධා හඳුනාගෙන ඒවා ජය ගැනීමට උනන්දුවෙන් යුතුව ක්‍රියා කරයි.<br>• තමාගේ සංවර්ධනය සඳහා පාසලෙන් සැපයෙන අවස්ථා උපරිම ලෙස ප්‍රයෝජනයට ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.1.4<br>පාසල් සමාජයේ සාමාජිකයෙකු ලෙස, අදාළ කාර්යයන් මනා සැලසුමක් සහිත ව හා සංවිධානාත්මක ව ඉටු කරයි | • දෛනික කටයුතු සැලසුම් සහගත ව ඉටු කිරීම<br>* උදෑසන අවදි වීමේ සිට රාත්‍රි නින්දට යාම දක්වා කටයුතු<br>* නියමිත වේලාවට පෙර, පාසලට යාම<br>* කාල සටහනට අදාළ ව පොත්පත් හා අවශ්‍ය ද්‍රව්‍ය රැගෙන යාම<br>* පාසල් කාල සටහනට අනුව කටයුතු කිරීම<br>* කාලය ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම<br>* පන්ති කාමරයේ හා පාසලේ පවිත්‍රතා කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට සහාය වීම<br>* පරිසර අලංකරණ කටයුතු පවත්වා ගෙන යාම<br>* පන්ති කාමරයේ සහ පාසලේ විශේෂ අවස්ථාවල දී සැලසුම් සහගත ව කටයුතු කිරීම | • තම දෛනික කටයුතු සැලසුම් සහගතව ඉටු කරයි.<br>• තම කාර්යයන් මනා සැලැස්මක් සහිතව හා සංවිධානාත්මකව ඉටු කිරීමේ වැදගත්කම අගය කරමින් අදහස් දක්වයි.<br>• විවිධ අවස්ථාවල දී සැලසුම් සහිත ව හා සංවිධානාත්මකව කටයුතු කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.1.5<br>පාසල් සංස්කෘතිය තුළ පවත්නා නීතිරීති හා සම්ප්‍රදායන්ට අනුගත වෙයි | • පාසලේ පවත්නා නීතිරීති<br>* පාසලට නීති පද්ධතියක් අවශ්‍ය වීමට හේතු, නීතිරීති පිළිබඳ දැනුවත් වීම, නීතිරීතිවලට අවනත වීම<br>• පාසලේ පවත්නා නීතිරීති<br>* නියමිත වේලාවට පාසලට පැමිණීම<br>* නියමිත ප්‍රමිතීන් අනුව සැකසූ නිල ඇඳුමින් සැරසී පාසල් පැමිණීම<br>* පාසල් කාලය තුළ පාසලේ රැඳී සිටීම<br>* පාසල් කාල සටහනට අනුව අධ්‍යයන කටයුතුවල නිරත වීම<br>* විදුහල්පතිට හා ගුරු මණ්ඩලයට ගරු කිරීම<br>* ශිෂ්‍යනායක නායිකාවන්ට, පන්ති නායක නායිකාවන්ට ගරු කිරිම හා සහෝදර සිසුන්ට ගරු කිරීම<br>* පාසලේ පවතින නිති ගරු කිරීම | • පාසලේ යහපැවැත්ම සඳහා නීති පද්ධතියක් අවශ්‍ය බව පැහැදිලි කරයි.<br>• පාසලේ පවත්නා සම්ප්‍රදායන් හඳුනාගෙන ඒවාට අනුගත වෙයි.<br>• නීති රීතිවලට ගරු කිරීමෙන් අන් අයගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන බව පිළිගෙන ඒ අනුව කටයුතු කරයි.<br>• තම යුතුකම් හා වගකීම් ඉටු කිරීම තුළින් පාසලේ කීර්තිනාමය හා ගෞරවය රැක ගැනීමට දායක වෙයි.<br>• පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේතවලට ගරු කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | • සම්ප්‍රදායන්<br>* සම්ප්‍රදායන් හඳුනා ගැනීම හා ගරු කිරීම<br>* සම්ප්‍රදායන්ට අනුගත වීම හා සම්ප්‍රදාය රැකගැනීමේ වැදගත්කම<br>• පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත<br>* **පාසල් ගීතය**<br>* පාසල් ගීතයක අවශ්‍යතාව<br>* පාසල මාතෘත්වයෙන් සලකා බොහෝ පාසල් ගී නිර්මාණය වී තිබීම<br>* පාසල් ගීතයේ අර්ථය<br>* ගායනා කරන අවස්ථා<br>* ගායනා කරන අවස්ථාවේ දී නිසි ගෞරව දැක්වීම<br>* **පාසල් කොඩිය**<br>* වර්ණ/සංකේතවලින් ප්‍රකාශ වන දේ<br>* කොඩිය ඔසවන අවස්ථා/ආකාරය<br>* ගෞරව කළ යුතු ආකාරය<br>* ගෞරව කිරීමේ වැදගත්කම | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | * **පාසලේ නිල ඇඳුම**<br>* නිල ඇඳුමේ ප්‍රමිති<br>* චාම් බව<br>* ක්‍රමානුකූල බව<br>* සමාන බව<br>* **පාසල් නිල ලාංඡනය**<br>* වර්ණ හා සංකේතවලින් ප්‍රකාශ වන දේ<br>* භාවිත කරන අවස්ථා<br>* **ආදර්ශ පාඨය**<br>* ඉන් කියවෙන අදහස<br>* එය ජීවිතයට ආදර්ශයක් විය යුතු බව<br>* **පාසලේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශය**<br>* පාසලෙන් සමාජයට වන මෙහෙය<br>* පාසල පිළිබඳ ව ඉදිරිපත් ව ඇති විද්වත් අදහස් | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.1.6<br>පාසල් සමාජයේ සාමාජිකයෙකු ලෙස, තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් ඒ හා බැඳුණු වගකීම් හා යුතුකම් ඉටු කරයි | • පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් තමන්ට ඇති අයිතිවාසිකම්<br>• එම අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර<br>• එම අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම්<br>* පාසලේ කීර්තියට හා ගෞරවයට හානි නොවන සේ හැසිරීම<br>* විනයගරුක වීම හා නීතිගරුක වීම<br>* අනන්‍යතාව ආරක්ෂා කිරීම<br>* සමානාත්මතාවෙන් හා සහජීවනයෙන් කටයුතු කිරීම<br>* පාසලේ භෞතික පරිසරය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම | • පාසල තුළ සෑම ශිෂ්‍යයෙකුට ම සමාන අයිතිවාසිකම් හිමිවන බව පිළිගෙන අදහස් දක්වයි.<br>• පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් ඒ හා බැඳුණු යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• පාසල් සමාජයේ සාමාජිකයෙකු ලෙස සහජීවනයෙන් හා සමානත්මතාවයෙන් යුතුව කටයුතු කරයි.<br>• පාසලේ භෞතික පරිසරය ආරක්ෂාකර ගැනීමට කැපවීමෙන් යුතුව දායක වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.1.7<br>ගුරු සිසු යුතුකම් පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි | • ගුරුවරුන් හා ශිෂ්‍යයින් අතර අන්‍යෝන්‍ය යුතුකම් ඉටුකිරීම<br>• සිසුන් සිසුන් අතර යුතුකම් හා වගකීම් ඉටු කිරීම | • ශිෂ්‍යයන් විසින් ගුරුවරු වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් හඳුනාගෙන ඒවාට අනුගත ව කටයුතු කරයි.<br>• ගුරුවරු විසින් ශිෂ්‍යයන් වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• සිසුන්, සිසුන් අතර යුතුකම් ඉටු කිරීමේ අගය විස්තර කරයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.1.8<br>පාසල හා සමාජය අතර සබඳතා විමසා බලයි | • පාසල හා සමාජය අතර අන්‍යෝන්‍ය සබඳතාවක් පැවතීම<br>• පාසලෙන් සමාජයටත් සමාජයෙන් පාසලටත් සැලසෙන සේවය<br>• පාසල හා ප්‍රජාව අතර පවතින විවිධ සබඳතා<br>උදා :- දෙමාපියන්/ආදි ශිෂ්‍යයන්/ සුබපතන්නන්/රාජ්‍ය ආයතන/රාජ්‍ය නොවන සංවිධාන/මහජන නියෝජිතයින්<br>• එම සබඳතා පාසලේ හා සමාජයේ දියුණුවට යොදා ගන්නා ආකාරය<br>• පාසලේ පැවැත්මට සමාජය අවශ්‍ය වීම හා සමාජයේ පැවැත්මට පාසල අවශ්‍ය වීම<br>• පාසල ආරක්ෂා කර ගැනීම සාමූහික වගකීමක් බව<br>• ළමා මිතුරු පාසල් සමාජයක් ගොඩ නැඟීම සඳහා ගුරු, සිසු, ප්‍රජා කාර්ය භාරය | • පාසල හා සමාජය අතර පවත්නා අන්‍යෝන්‍ය සබඳතාවල ස්වරූපය විස්තර කරයි.<br>• පාසල හා සමාජය අතර සම්බන්ධතාව සමාජ සංවර්ධනයට උපකාරී වන අයුරු විස්තර කරයි.<br>• පාසල ආරක්ෂා කර ගැනීම සමාජ වගකීමක් මෙන් ම යුතුකමක් බව පැහැදිලි කරයි<br>• ළමා මිතුරු පාසල් සමාජයක් ගොඩනැඟීම සඳහා ගුරු සිසු ප්‍රජා කාරයභාරය පැහැදිලි කරයි | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- | --- |
| **අප ජීවත් වන ප්‍රදේශය**<br>6.2<br>ප්‍රදේශයේ මානව හා භෞතික සම්පත් සමාජයේ යහපැවැත්මට දායක කර ගනියි | 6.2.1<br>තමා ජීවත් වන ප්‍රදේශයේ සම්පත් අගය කරමින් ඒවා සංරක්ෂණය කිරීමට කටයුතු කරයි | • තම ප්‍රදේශයේ පිහිටීම<br>* පළාත<br>* දිස්ත්‍රික්කය<br>* ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය<br>* ග්‍රාම නිලධාරි කොට්ඨාසය<br>• භෞතික සම්පත් හඳුනා ගැනීම<br>උදා වාතය/ජලය/පස/ඛනිජ/කඳු/ දියඇලි/ගංගා/වනාන්තර/ ස්වාභාවික වෘක්ෂලතා/වන සතුන්<br>• නූතන පුද්ගල හා සමාජ, ආර්ථික අවශ්‍යතා අනුව ඒවා ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම<br>• ප්‍රදේශයේ භෞතික සම්පත් සීමිත බැවින් ඒවා අරපිරිමැස්මෙන් භාවිත කිරිම හා සංරක්ෂණය කිරිම<br>• මානව සම්පත් හඳුනා ගැනීම<br>* මිනිසාගේ බුද්ධිමය හැකියා සහ කායික හැකියා පදනම් කරගෙන | • තම ප්‍රදේශයේ පිහිටීම පරිපාලන ඒකක ඇසුරින් පැහැදිලි කරයි.<br>• තම ප්‍රදේශයේ භෞතික සම්පත් හඳුනාගෙන නම් කරයි.<br>• ප්‍රදේශයේ භෞතික සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීමේ හා සංරක්ෂණය කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• මානව සම්පත් සංවර්ධනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරයි. | 07 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | මානව සම්පත් සකස් වීම<br>උදා :- බුද්ධිමය හැකියා ආශ්‍රිත මානව සම්පත්<br>• මානව සම්පත් ගුණාත්මකභාවයෙන් වැඩි දියුණු කිරීම | | |
| | 6.2.2<br>ප්‍රදේශවාසීන් සමඟ සාමූහිකත්වයෙන් යුතු ව ජීවත් වීමට ඇති සූදානම ප්‍රදර්ශනය කරයි | • ප්‍රදේශවාසීන් අතර සාමූහිකත්වය කැපී පෙනෙන අවස්ථා<br>* තම පවුලේ මෙන්ම තම ප්‍රදේශයේ දියුණුවට එහි සාමාජිකයන්ගේ එකමුතු බව හා ක්‍රියාශීලී සහයෝගය අවශ්‍ය වීම<br>උදා :- වැව් නිර්මාණය<br>දාගැබ්/කෝවිල් පල්ලි නිර්මාණය<br>මංගල්‍ය/අවමංගල්‍ය අවස්ථා/ ආගමික අවස්ථා/ගොවිතැන් කටයුතු දන්සල්/කඨින පිංකම්/පෙරහැර අවස්ථා/ ශ්‍රමදාන | • ප්‍රදේශවාසීන් අතර සාමූහිකත්වය කැපී පෙනෙන අවස්ථා නම් කරයි.<br>• සාමූහික ව කටයුතු කිරීමේ වැදගත්කම අගය කරමින් අදහස් ප්‍රකාශ කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | • සාමූහික ව කටයුතු කිරීමෙන් අත්වන ප්‍රයෝජන<br>* වැඩ කටයුතු පහසුවෙන් හා ඉක්මනින් කර ගත හැකි වීම<br>* පුද්ගලයින් අතර සුහදත්වය ඇති කර ගත හැකි වීම<br>* සමගිය හා සහෝදරත්වය වැඩි දියුණු වීම<br>* පාරම්පරික සිරිත්විරිත් පවත්වා ගෙන යා හැකි වීම<br>* මුදලින් කර ගත නොහැකි දේ සාමූහික ප්‍රයත්නයන්ගෙන් ඉටු කර ගත හැකි වීම<br>* සාමූහික ව වැඩ කිරීමෙන් සතුට හා වින්දනය ලැබීම | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.2.3<br>විවිධ පුද්ගලයින් හා ආයතන, තම දෛනික දිවි පැවැත්මට අවශ්‍ය බව තේරුම් ගෙන කටයුතු කරයි | • පුද්ගලයෙකු සමාජය තුළ ජීවත් වීමේ දී තම අවශ්‍යතා තනි ව සපුරා ගැනීමේ අපහසුතාව<br>• විවිධ පුද්ගලයින්ගේ සහ සංවිධානවල සහාය ඒ සඳහා අවශ්‍ය වීම<br>• විවිධ කාර්ය ඉටු කිරීමට පුද්ගලයින් හා සංවිධාන සමාජය තුළ බිහි වී තිබීම<br>• අපට උදව් කරන්නන් හා ඉටුවන සේවා<br>උදා :- ග්‍රාම නිලධාරි<br>සමෘද්ධි නිලධාරි<br>පවුල් සෞඛ්‍ය නිලධාරිනිය<br>මහජන සෞඛ්‍ය පරීක්ෂක<br>තැපැල්කරු<br>පොලිස් නිලධාරි ආදි<br>• අපට උදව් කරන ආයතන හා ඒවායෙන් ඉටු වන සේවා<br>උදා :- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පළාත් පාලන ආයතන (මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා), පාසල, රෝහල, පොලීසිය | • සමාජ අවශ්‍යතා ඉටු කිරීම සඳහා සහාය වන විවිධ පුද්ගලයින් හා සංවිධාන නම් කරයි.<br>• අපට උදවු කරන ආයතනවලින් හා පුද්ගලයින්ගෙන් ඉටුවන සේවා වෙන් වෙන්ව ලැයිස්තු ගත කරයි.<br>• ප්‍රදේශවාසීන් තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා පිහිටුවාගෙන ඇති සමිති සමාගම්වලින් සිදුවන සේවා අගය කරමින් අදහස් දක්වයි.<br>• සේවා සපයන්නන්ගේ සහ සේවාලාභීන් ගේ යුතුකම් හා වගකීම් විස්තර කරයි. | 07 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | | • ප්‍රදේශයේ සිද්ධස්ථාන, සමිති සමාගම්, ආයතන මගින් ඉටු වන සේවා<br>සිද්ධස්ථාන<br>බෞද්ධාගමික - පන්සල<br>හින්දු ආගමික - කෝවිල්<br>ඉස්ලාම් ආගමික - මස්ජිද<br>ක්‍රිස්තියානි/කතෝලික ආගමික-පල්ලි,<br>* මෙහිදී තම ප්‍රදේශය තුළ ඇති පන්සල්, කෝවිල්, පල්ලි හඳුනා ගැනීම<br>• සිද්ධස්ථානවලින් ඉටුවන සේවා<br>* මිනිසාගේ ආධ්‍යාත්මික ගුණ වගාවන් වර්ධනය කිරීම<br>* හික්මීම, විනයගරුකබව හා සදාචාර සම්පන්න බව වර්ධනය කිරීම<br>* කරුණාව, දයාව, මෛත්‍රිය, ඉවසීම වැනි ගුණාංග වර්ධනය කිරීම<br>* දහම් දැනුම ලබා දීම<br>* සමාජයේ ආගමික අවශ්‍යතා ඉටු කිරීම<br>උදා :- දානමය පිංකම්වල දී | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- | --- |
| | | අවමංගල්‍ය කටයුතුවල දී<br>මංගල්‍ය කටයුතුවල දී<br>* අවවාද අනුශාසනා ලබා දීම<br>උදා :- ගැටුම් අවස්ථාවල දී පවුල්, ආරවුල්වල දී, සමිති සමාගම් පවත්වා ගෙන යාමේ දී<br>• ආගමික ආයතන හා සමාජය අතර යහපත් බැඳීමක් ඇති කරමින් සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම<br>• ප්‍රදේශයේ සමිති සමාගම්<br>* ප්‍රදේශවාසීන්ගේ සමාජ,ආර්ථික, සංස්කෘතික, පාරිසරික ආදි විවිධ පොදු අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සමිති සමාගම් පිහිටුවා ගෙන ඇති බව<br>උදා:- සමුපකාර සමිති, ගොවි සමිති, ධීවර සමිති, ග්‍රාම සංවර්ධන සමිති, බෞද්ධ සමිති, අවමංගල්‍යාධාර සමිති, ක්‍රීඩා සමිති<br>• ප්‍රදේශයේ ඇති සමිති සමාගම්වලින් සිදුවන සේවා<br>• සේවා සපයන්නන්ගේ සහ සේවා ලබන්නන්ගේ යුතුකම් | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| **යහපත් පුරවැසියෙකු වශයෙන් ප්‍රගුණ කළ යුතු ගුණාංග**<br>6.3<br>යහපත් ගුණාංග වලින් හෙබි සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට සූදානම ප්‍රදර්ශනය කරයි | 6.3.1<br>ආචාරශීලී ව භාෂාව භාවිත කරයි. | • සංවරශීලී ව ප්‍රියමනාප ව හා නිවැරදි ව අන්‍යයන්ට ගෞරවයක් ඇති වන පරිදි භාෂාව භාවිත කිරීම<br>• ආචාරශීලී ව භාෂාව භාවිත කිරීම<br>උදා :- පූජ්‍ය පක්ෂය සමඟ, ගුරුවරුන් සමඟ, වැඩිහිටියන් සමඟ, සමවයස් කණ්ඩායම් සමඟ<br>• ස්ථානයට හා අවස්ථාවට අනුව භාෂාව හැසිරවීම | • ආචාරශීලී ව භාෂාව භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• ආචාරශීලී ව භාෂාව භාවිතයේ දී සැලකිලිමත් විය යුතු ගුණාංග ප්‍රදර්ශනය කරයි.<br>• අවස්ථාවෝචිත ව භාෂාව භාවිත කරයි. | 01 |
| | 6.3.2<br>අන්මත ගරු කරමින් සාකච්ඡා මඟින් සම්මුතිවලට එළඹෙයි | • ප්‍රගුණ කළ යුතු සන්නිවේදන කුසලතා<br>* සක්‍රිය සවන් දීම<br>* සමාජය සමඟ කටයුතු කිරීමේ දී අන්‍ය මත ඉවසීම<br>* නිවැරදි අදහස්වලට ගරු කිරීම<br>* අන්‍යයන්ට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම<br>* නොගැළපෙන අදහස් ගැටුමකින් තොරව සමනය කිරීම<br>* අන්‍යමත ඉවසීමේ වැදගත්කම | • සන්නිවේදන කාර්යයේ දී සක්‍රීය ව සවන් දීමේ යෙදෙයි.<br>• අන්‍යමත ඉවසීමේ වාසි විස්තර කරයි.<br>• එදිනෙදා කටයුතුවල දී සාකච්ඡා මගින් සම්මුතිවලට එළඹෙයි.<br>•ඵලදායී සන්නිවේදනය මඟින් යහපත් අන්තර් පුද්ගලසබඳතා ගොඩනගා ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.3.3<br>මනා විනයකින් හා ශික්ෂණයකින් යුතු ව කටයුතු කරයි | • 'විනය' හා 'ශික්ෂණය' හැඳින්වීම<br>• ශික්ෂණය ඇති කිරීම සඳහා ඉගෙනීම, ඉගැන්වීම හා පුහුණුව යන අංශ තුන ම ප්‍රගුණ කළ යුතු වීම<br>• පුද්ගලයෙක් තම ජීවිත කාලය තුළ මනා විනයක් හා ශික්ෂණයක් පවත්වා ගත යුතු වීම<br>• මනා විනයක් හා ශික්ෂණයක් පවත්වා ගෙන යාමේ වැදගත්කම | • විනය හා ශික්ෂණය ඇති කරවන පොදු ගුණාංග විස්තර කරයි.<br>• විනය හා ශික්ෂණය පුද්ගලයෙකුට තම ජීවිත කාලය පුරා ම පවත්වා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>• එදිනෙදා ජීවිතයේ දී මනා විනයකින් හා ශික්ෂණයකින් යුතුව කටයුතු කරයි. | 02 |
| | 6.3.4<br>සමාජයේ පවතින සරු දේ සරු දේ ලෙස හඳුනාගෙන පිළිගන්නා අතර නිසරු දේ නිසරු දේ ලෙස හඳුනා ගෙන ප්‍රතික්ෂේප කරයි | • සමාජයේ ක්‍රියාත්මක වන සරු දේ හඳුනා ගැනීම<br>• සමාජයේ යහ පැවැත්මට අදාළ දේවල් සරු ලෙස පිළිගැනීම<br>• සමාජයේ ක්‍රියාත්මක වන නිසරු දේ හඳුනා ගෙන පිටු දැකීම<br>• සමාජයේ පිරිහීමට හේතු වන දේ නිසරු දේ ලෙස සලකමින් ප්‍රතික්ෂේප කිරීමට හුරු වීම | • සමාජය තුළ ඇති සරු, නිසරු දේ වෙන් කර දක්වයි.<br>• සමාජයේ සරු දෙයට අනුගතව කටයුතු කිරීමට සුදුසු ක්‍රම යෝජනා කරයි.<br>• සමාජයේ නිසරු දේ පිටු දකින ආකාරය පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.3.5<br>සමාජ සම්ප්‍රදාය හා නීතිරීති ගරු කරයි | • සම්ප්‍රදාය හැඳින්වීම<br>• නීති හැඳින්වීම<br>• සෑම නීතියක් හා බැඳුණු දඬුවමක් පැවතීම<br>• නීතිරීති, සම්ප්‍රදායන් ගරු කිරීමේ වැදගත්කම | •නීතිරීති, සම්ප්‍රදායන් ගරු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>•සමාජ සම්ප්‍රදායන් හා නීතිරීති අනුගමනය කිරීමට හුරුවක් ලබයි. | 02 |
| | 6.3.6<br>සම්පත් අරපිරිමැස්මෙන් පරිහරණය කරයි | • සම්පත් හැඳින්වීම<br>• සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීමේ වැදගත්කම<br>• පාසල් ශිෂ්‍යයකු වශයෙන් සම්පත් නාස්තිය වැළැක්විය හැකි අවස්ථා<br>• සම්පත් නාස්තිය වැළැක්වීමේ වැදගත්කම | •සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කළ යුතු බව පැහැදිලි කරයි.<br>•පාසල් ශිෂ්‍යයෙකු ලෙස සම්පත් නාස්තිය වැළැක්වීමේ ක්‍රමෝපා අනුගමනය කරයි.<br>•සම්පත් නාස්තිය වළක්වා ගැනීමෙන් ඇතිවන වාසි පෙළගස්වයි.<br>•ආසන්න පරිසරයේ සම්පත් නාස්තිය අවම කිරීමට දායක විය හැකි අවස්ථා පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- | --- |
| | 6.3.7<br>පොදු දේපළ වගකීමෙන් යුතුව සුරකියි. | • පොදු දේපළ හැඳින්වීම<br>• පොදු දේපළවල ලක්ෂණ<br>• පොදු දේපළ සුරැකීම හා එහි වැදගත්කම<br>• පොදු දේපළ ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග | •පොදු දේපළ නිපදවීම හා නඩත්තුව සඳහා රජය විශාල වියදමක් දරන බව පිළිගනිමින් කරුණු පැහැදිලි කරයි.<br>•පොදු දේපළ සුරැකීමට ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.<br>• පොදු දේපළ ආරක්‍ෂා කිරීමේ වැදගත්කම පිළිබඳ ප්‍රජාව දැනුවත් කරයි.<br>•පොදු දේපළ තම අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගනිමින් ඒවා සුරකියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.3.8<br>පරිසර සංරක්‍ෂණය මගින් තිරසර සංවර්ධනයට සක්‍රිය ව දායක වෙයි | • 'පරිසරය' හැඳින්වීම<br>• පරිසරය අපගේ පැවැත්මට අත්‍යවශ්‍ය බව<br>• මිනිසා ද පරිසරයේ කොටසක් බව<br>• මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසරයට සිදු වන හානි<br>• පරිසර සංරක්ෂණයේ වැදගත්කම හා අනාගත පරපුරට ආරක්‍ෂා කර දිය යුතු බව | • තමා අවට පරිසරය සංරක්‍ෂණයට දායක විය හැකි ආකාර ප්‍රකාශ කරයි.<br>• පරිසර සංරක්‍ෂණයේ වැදගත්කම හා එයින් ඇතිවන වාසි විස්තර කරයි.<br>• තමාද පරිසරයේ කොටසක් සේ සලකා ක්‍රියාකළ යුතු බවට අදහස් දක්වයි.<br>• පරිසර සම්පත් අනාගත පරපුරට ආරක්‍ෂා කර තැබීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- | --- |
| | 6.3.9<br>දේශීයත්වය අභිමානයෙන් අගය කරයි | • දේශීය දේ හැඳින්වීම<br>* දේශීය සංස්කෘතිය<br>* දේශීය සම්පත්<br>* දේශීය නිෂ්පාදන<br>• දේශීය දේ අගය කිරීමේ වැදගත්කම<br>• දේශීය දේ සුරැකීම | • දේශීය සංස්කෘතික උරුමයන් පිළිබඳ විස්තර අභිමානයෙන් යුතු ව ඉදිරිපත් කරයි.<br>• දේශීය නිෂ්පාදන, දේශීය ව වැවෙන දේ පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• දේශීය දේ අගය කරමින් අභිමානයෙන් ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.<br>• දේශීය උරුමයන් ආරක්ෂා කිරීමට දායක විය හැකි ආකාර පැහැදිලි කරයි. | 03 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# 6.1 අපේ පාසල

අතීත ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය කේන්ද්‍රගත ව තිබුණේ පන්සල් හා පිරිවෙන් ආශ්‍රිත ව වේ. ඊට අමතර ව ගුරු ගෙදර ද එකල ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථානයක් විය. ශාස්ත්‍රීය අධ්‍යාපනය මෙන් ම විවිධ වෘත්තීන් පදනම් කරගත් ශිල්පීය අධ්‍යාපනය ද එකල විෂයමාලාවට ඇතුළත් ව තිබුණි.

එහෙත් සමාජ විකාශන ක්‍රියාවලිය තුළ ජනගහනය අධික වීම හා ඔවුන්ගේ අවශ්‍යතා සංකීර්ණ වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජ අවශ්‍යතාවක් ලෙස සලකා රජය මෙන් ම ප්‍රභූන් විසින් ද පාසල් පිහිටු වීමට ක්‍රියා කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ රජයේ හා පෞද්ගලික පාසල් බිහි ව තිබේ.

පුද්ගලයා සමාජයට අවශ්‍ය පරිදි හැඩගස්වා යොමු කරනු ලබන ප්‍රධාන සමාජානුයෝජන කාරක අතුරින් එකක් වන්නේ පාසල යි. එමනිසා සමාජයේ එකී පැතිකඩක් ලෙස පාසල හැඳින්විය හැකි ය. සමාජ පැවැත්ම තහවුරු කරනු ලබන ප්‍රධාන සාධකය වන්නේ ද පාසල යි.

සමාජය තුළ පුද්ගලයින් සහජීවනයෙන් යුතු ව එක් ව ජීවත් වන ආකාරය තහවුරු කිරීම මෙන් ම, එකිනෙකාට ගරු කිරීමත්, යුතුකම් ඉටු කරමින් අයිතිවාසිකම් භුක්ති විඳීමට හුරු කිරීමත් පාසලෙන් ඉටුවන ප්‍රධාන මෙහෙයන්ගෙන් කිහිපයකි. ඒ හැරුණු විට පවුල් ඒකකයෙන් බැහැර ව දීර්ඝ කාලයක් සාමාජිකත්වය දරන ආයතනය ලෙස ද පාසල හැඳින්විය හැකි ය. එමගින් ද දරුවකු විශාල අත්දැකීම් සම්භාරයක් ලබා ගනියි. එම නිසා පාසල් සමාජයේ සාමාජිකයෙකු බවට පත් වීමෙන් පසු දරුවෙකු එහි ආරම්භය හා විකාශනය, එය ගොඩනගා ඇති සංවිධාන ව්‍යුහය, තම අනන්‍යතාව තහවුරු කර ගැනීමේ වැදගත්කම, තම කාර්යයන් මනා සැලසුමකින් යුතු ව ඉටු කිරීමේ වටිනාකම, පාසල් සංස්කෘතියට ගරු කිරීම, සමාජය හා පාසල අතර ඇති සම්බන්ධතාව ය වැනි දෑ පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ. එමගින් පාසල පිළිබඳ යහපත් ආකල්ප ජනිත කිරීමට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ අවස්ථාව උදා කිරීම මෙම ඒකකය තුළින් අපේක්ෂා කෙරේ.

## 6.1 අපේ පාසල

**නිපුණතාව**

- ක්‍රියාශීලී සාමාජිකයෙකු වශයෙන් පාසල් සමාජයේ සංවර්ධනයට දායක වෙයි.

**නිපුණතා මට්ටම**

6.1.1 පාසලේ ආරම්භය හා විකාශනය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02**

**ඉගෙනුම් පල**

- පාසලේ ආරම්භය පිළිබඳ මූලික තොරතුරු පැහැදිලි කරයි.
- පාසල ආරම්භ කිරීමට මුල් වූ පුද්ගලයින්ගේ සේවය අගය කරමින් අදහස් දක්වයි.
- පාසල ආරම්භ වූ අවධියේ ගමේ/ නගරයේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- පාසලෙන් සිදුවන සේවය අගය කරමින් අදහස් දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ආරම්භක පසුබිම
  - ආරම්භ කිරීමට මුල් වූ හේතු

  උදාහරණ – ජනගහන වර්ධනය
  – ආසන්නයේ පාසලක් නොතිබීම
  – රාජ්‍ය ප්‍රතිපත්ති
  – සමාජ අවශ්‍යතාව
- ආරම්භ වූ ආකාරය

  උදාහරණ:- රජයේ පාසලක් ලෙස/ පෞද්ගලික පරිත්‍යාගයක් ලෙස/ ප්‍රභූවරයෙකු ගේ/ දානපතියකුගේ පරිත්‍යාගයක් ලෙස/ ආගමික ස්ථානයක් ලෙස/ ආගමික ස්ථානයක් මුල් කර ගෙන .... ආදි වශයෙන්
- ආරම්භ කිරීමට මුල් වූ පුද්ගලයන්

  උදාහරණ:- ගමේ ප්‍රභූවරයෙකු/ දානපතියෙකු ආදි වශයෙන්
- ප්‍රථමයෙන් ආරම්භ කළ ස්ථානය හා වර්ෂය
- පාසලේ වර්ධනයේ වැදගත් අවස්ථා

  උදාහරණ - පාසල මහා විද්‍යාලයක් බවට පත්වීම
  - මධ්‍ය විද්‍යාලයක් බවට පත්වීම
- පාසල ආරම්භ කරන කාලයේ ගමේ/ නගරයේ පසුබිම

  උදාහරණ - සමාජ ආර්ථික කටයුතු
  - ජීවනෝපාය මාර්ග
- පාසලෙන් බිහි වූ දීප්තිමත් ආදි සිසුන්

  උදාහරණ - සමාජ සේවකයන්
  - විවිධ වෘත්තීන්ට අයත් නිලධාරීන්

(• සමාජයට ඉමහත් සේවයක් කරන ආයතනයක් ලෙස පාසල පිළිබඳ ව අභිමානයෙන් යුතු ව ඇගයීමට සිසුන් යොමු කරන්න)

**ගුණාත්මක යෙදවුම්**

මෙම නිපුණතා මට්ටම ආවරණය කිරීම සඳහා පාඩම් සැලසුම් කිරීමේ දී ගුණාත්මක යෙදවුම් ලෙස පාසලේ ලොග් සටහන් පොත, පාසල මගින් විවිධ අවස්ථාවල පළකර ඇති ලිපි ලේඛන, සඟරා ආදිය සහ පාසල පිළිබඳ තොරතුරු දන්නා සම්පත් පුද්ගලයින් වේ නම් යොදා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

මෙම නිපුණතා මට්ටම ආවරණය කිරීම සඳහා සැලසුම් කළ පාඩමට අදාළ ව පාසලේ ඉතිහාසය පිළිබඳ ව බිත්ති පුවත්පතකට සුදුසු ලිපියක් සකස් කිරීමට යොමු කර ඒ ඔස්සේ ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.1.2 පාසලේ සංවිධාන ව්‍යුහය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02**

**ඉගෙනුම් පල**

- පාසලේ සංවිධාන ව්‍යුහය දළ සැළැස්මක් මගින් නිරූපණය කරයි.
- පාසලේ විවිධ භූමිකා නිරූපණය කරන අය තම යුතුකම් ඉටු කිරීම පාසලේ ඵලදායීතාව කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරයි.
- පාසලේ කාර්ය සාධනයෙහිලා සෑම සාමාජිකයෙකුගේ ම සක්‍රිය දායකත්වය තිබිය යුතු බව පිළිගනිමින් අදහස් දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)**

- පාසලේ සංවිධාන ව්‍යුහය
  - පාසලක ශිෂ්‍ය සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව, අනුව මෙම සංවිධාන ව්‍යුහය වෙනස් විය හැකි ය. ඔබේ පාසලට අදාළ සංවිධාන ව්‍යුහය ඉදිරිපත් කරන්න.
- පාසලේ සංවිධාන ව්‍යුහයේ විවිධ භූමිකා හා නිලතලවලට අයත් වගකීම් හා යුතුකම්.
  - විදුහල්පති
  - ගුරුවරු
  - අනධ්‍යයන කාර්ය මණ්ඩලය

    ( එක් එක් භූමිකාවට අදාළ ව කරුණු සාකච්ඡා කරන්න)
- විවිධ නිලතල දරන පුද්ගලයින් තම වගකීම් හා යුතුකම් ඉටු කිරීමෙන් පාසලේ සාර්ථකත්වයට ඇති කරන බලපෑම.
- සෑම සාමාජිකයෙකු ම පාසල් සංවිධාන ව්‍යුහයේ කොටස්කරුවකු වන බව.

**ගුණාත්මක යෙදවුම්**

පාසලේ සංවිධාන ව්‍යුහයේ දළ සැලැස්මක් යොදා ගන්න. (පෙළ පොතෙහි ආදර්ශ දළ සැලැස්මක් දක්වා ඇත)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීම සඳහා පාසලේ සංවිධාන ව්‍යුහයට අයත් නිලතල, ඒ ඒ නිලයන්ට අයත් යුතුකම් හා වගකීම් සහ සංවිධාන ව්‍යුහය පිළිබඳ ව සිසුන් ඉදිරිපත් කරන කරුණු අනුසාරයෙන් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.1.3 පාසල් සමාජයේ සාමාජිකයෙකු ලෙස තමා පිළිබඳ තොරතුරුවල අවශ්‍යතාව විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02**

**ඉගෙනුම් පල**

- පාසල තුළ තම අනන්‍යතාව ගොඩනගා ගැනීමට ආධාර වන තොරතුරු සපයයි.
- තමා සතු හොඳ ලක්ෂණ හඳුනා ගෙන ඒවා වර්ධනය කර ගැනීමට කටයුතු කරයි.
- තම දුර්වලතා හඳුනා ගෙන ඒවා අවම කර ගැනීමට කටයුතු කරයි.
- තමන්ට ඇති බාධා හඳුනා ගෙන ඒවා ජය ගැනීමට උනන්දුවෙන් යුතු ව ක්‍රියා කරයි.
- තමාගේ සංවර්ධනය සඳහා පාසලෙන් සැපයෙන අවස්ථා උපරිම ලෙස ප්‍රයෝජනයට ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් **සකස් කර** ගන්න)

(පාසල් ශිෂ්‍යයෙකු ලෙස තම අනන්‍යතාව ගොඩනගා ගැනීමට සහ තම දක්ෂතා වර්ධනය කර ගැනීමට ආධාර වන තොරතුරු පෙළ පොතේ දක්වා ඇති පරිදි සාකච්ඡා කරන්න.)

- තම අනන්‍යතාව ගොඩනගා ගැනීමට අදාළ වන තොරතුරු
- තමන් සතු හොඳ ගති ලක්ෂණ
- තමන්ගේ දක්ෂතා

උදාහරණ:- ඉගෙනීමේ කටයුතු / ක්‍රීඩා කටයුතු/ විෂය සමගාමී ක්‍රියාකාරකම්/ යහපත් සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීම/ සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්/ කාලය ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම

- තම දුර්වලතා හඳුනා ගැනීම
  - එක් එක් ශිෂ්‍යයාට තමා තුළ පවතින දුර්වලතා හඳුනා ගැනීමට මග පෙන්වීම
  - ඒවා අවම කර ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පැහැදිලි කිරීම
- තමන්ට ඇති බාධා/ අභියෝග
  - තමන් අපේක්ෂිත ඉලක්ක කරා ගමන් කිරීමේ දී මතු වන බාධා හඳුනා ගැනීමට අවස්ථාව සලසා දීම.
  - එම බාධා ජය ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හඳුන්වා දීම
- තමන්ගේ සංවර්ධනය සඳහා පාසලෙන් ලැබෙන අවස්ථා

  උදාහරණ - මනා අධ්‍යාපනයක් ලබා දීම
  - ක්‍රීඩා හා නායකත්ව පුහුණුව
  - යහපත් ආකල්ප සංවර්ධනය කිරීම
  - සමාජ කුසලතා සංවර්ධනය කිරීම
- යහපත් සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා ජීවන ඉලක්ක ගොඩනගා ගැනීමට මග පෙන්වීම.
- එම ඉලක්ක ජය ගැනීම සඳහා මෙන් ම සංවර්ධනය කර ගැනීමට අවස්ථා සම්පාදනය කිරීම.

**ගුණාත්මක යෙදවුම්**

- තම අනන්‍යතාව දැක්වෙන පරිදි විස්තර ලබා ගැනීමට සුදුසු ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක් සකස් කර ගන්න. ආදර්ශ ආකෘතියක් ඇමුණුම් 6.1.3.1 හි දක්වා ඇත.
- තමන් සතු හොඳ ගති ලක්ෂණ, දුර්වලතා ආදිය සටහන් කිරීම සඳහා ස්වයං ඇගයීම් පත්‍රිකාවක් යොදා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

- ජීව දත්ත තොරතුරු පත්‍රිකාව හා ස්වයං ඇගයීම් පත්‍රිකාව සම්පූර්ණ කිරීම ඇගයීමට ලක්කර තක්සේරු නිර්ණායක අනුව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

තම අනන්‍යතාව දැක්වෙන පරිදි පහත සඳහන් පත්‍රිකාව (ඇමුණුම 6.1.3.1) සම්පූර්ණ කරන්න.

ඇමුණුම 6.1.3.1

**ජීව දත්ත පත්‍රිකාව**

1. මුලකුරු සමග නම :- ..........................................................................
2. උපන් දිනය :- ..........................................................................
3. මෙම වර්ෂයේ ජනවාරි 01 දිනට වයස :-

| අවු. | මාස | දින |
|---|---|---|
| | | |

4. පෞද්ගලික ලිපිනය :- ..........................................................................
5. දුරකථන අංකය ( තිබේ නම් පමණක්) :- ..........................................................................
6. හදිසි අවස්ථාවක දී දැනුම් දිය යුතු අයගේ නම සහ ලිපිනයඃ-

..........................................................................

..........................................................................

ඔහුගේ/ ඇයගේ දුරකථන අංකය :- ..........................................................................
(තිබේ නම් පමණක්)

7. ඔබේ පාසලේ නම :- ..........................................................................
8. ලිපිනය :- ..........................................................................

..........................................................................

9. පාසලේ දුරකථන අංකයඃ-..........................................................................
10. පාසලට ඇතුළත් වූ දිනය :-..........................................................................
11. පාසලේ සිට ඔබ පදිංචි ස්ථානයට ඇති දුරඃ- ..........................................................................

....................................

අත්සන

**නිපුණතා මට්ටම**

6.1.4 පාසල් සමාජයේ සාමාජිකයෙකු ලෙස අදාළ කාර්යයන් මනා සැලැස්මක් සහිතව හා සංවිධානාත්මක ව ඉටු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 03

**ඉගෙනුම් පල**

- තම දෛනික කටයුතු සැලසුම් සහගත ව ඉටු කරයි.
- තම කාර්යයන් මනා සැලැස්මක් සහිත ව හා සංවිධානාත්මක ව ඉටු කිරීමේ වැදගත්කම අගය කරමින් අදහස් දක්වයි.
- විවිධ අවස්ථාවල දී සැලසුම් සහිත ව හා සංවිධානාත්මක ව කටයුතු කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් **සකස් කර** ගන්න)

- දෛනික කටයුතු සැලසුම් සහගත ව ඉටු කිරීම
  - උදෑසන අවදි වීමේ සිට රාත්‍රී නින්දට යාම දක්වා කටයුතු මනා සැලසුමකින් හා සංවිධානාත්මක ව ඉටු කිරීමේ වැදගත්කම

උදාහරණ - නියමිත වේලාවට පෙර, පාසලට යාම
- කාලසටහනට අදාළ පොත් පත් හා අවශ්‍ය ද්‍රව්‍ය රැගෙන යාම
- පාසල් කාලසටහනට අනුව කටයුතු කිරීම
- කාලය ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම
- පාසලේ හා පන්ති කාමරයේ හා පාසලේ පවිත්‍රතා කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට සහාය වීම
- පරිසර අලංකරණ කටයුතු පවත්වා ගෙන යාම
- පන්ති කාමරයේ හා පාසලේ විශේෂ අවස්ථාවල දී සැලසුම් සහගත ව කටයුතු කිරීම

උදාහරණ :- ක්‍රීඩා උත්සව/ විවිධ ප්‍රසංග/ ත්‍යාග ප්‍රදානෝත්සව/ ගුරු උපහාර උළෙල/ ළමා දින සැමරුම් උත්සව... .ආදිය ( මෙවැනි අවස්ථාවක් සැලසුම් කිරීමට සිසුන් යොමු කරන්න)

**ගුණාත්මක යෙදවුම්**

උදේ පිබිදීමේ සිට රාත්‍රී නින්දට යාම දක්වා කරන කාර්යයන් ක්‍රමවත් ව ඉටු කිරීම සඳහා දෛනික කාල සටහනක් පිළියෙල කිරීම, පන්තිය පිරිසිදු කිරීම, පාසල් වත්ත අලංකරණය සඳහා සුදුසු සැලසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පවරන ලද කාර්යයන් ඉටු කිරීම සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.1.5 පාසල් සංස්කෘතිය තුළ පවත්නා නීතිරීති හා සම්ප්‍රදායන්ට අනුගත වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 04**

**ඉගෙනුම් පල**

- පාසලේ යහපැවැත්ම සඳහා නීති පද්ධතියක් අවශ්‍ය බව පැහැදිලි කරයි.
- පාසලේ පවත්නා සම්ප්‍රදායන් හඳුනා ගෙන ඒවාට අනුගත වෙයි.
- නීති රීතිවලට ගරු කිරීමෙන් අන් අයගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන බව පිළිගෙන ඒ අනුව කටයුතු කරයි.
- තම යුතුකම් හා වගකීම් ඉටු කිරීම තුළින් පාසලේ කීර්තිනාමය හා ගෞරවය රැක ගැනීමට දායක වෙයි.
- පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේතවලට ගරු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් **සකස් කර** ගන්න)

- පාසලට නීති පද්ධතියක් අවශ්‍ය වීමට හේතු:-
    - පාසලේ යහපැවැත්ම සඳහා
    - පාසලෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා
    - පාසල් සාමාජිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා
- නීතිරීති පිළිබඳ දැනුවත් වීමේ වැදගත්කම
    - නීති මැනවින් පිළිපැදීමට
    - අන් අයගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට
    - තම අයිතිවාසිකම් භුක්ති විඳීම සඳහා
    - තමන්ගේ යුතුකම් හා වගකීම් මැනවින් ඉටු කිරීම පිණිස
- නීතිරීතිවලට අවනත වීම
    - නීතිරීතිවලට අවනත වීම පාසලේ යහපතට හේතු වන බව
    - නීතිරීති කඩ කිරීම පාසලේ යහපැවැත්මට හානි කර බව
- පාසලේ පවත්නා නීතිරීති
    - නියමිත වේලාවට පෙර පාසලට පැමිණීම
    - නියමිත ප්‍රමිතීන් අනුව සැකසූ නිල ඇඳුමෙන් සැරසී පාසලට පැමිණීම
    - පාසල් කාලය තුළ පාසලේ රැඳී සිටීම
    - පාසල් කාලසටහනට අනුව අධ්‍යයන කටයුතුවල නිරත වීම
    - විදුහල්පතිතුමාට, ගුරු මණ්ඩලයට ගරු කිරීම
    - ශිෂ්‍යනායක නායිකාවන්ට, පන්ති නායක නායිකාවන්ට ගරු කිරීම හා සහෝදර සිසුන්ට ගරු කිරීම

- සම්ප්‍රදායන්
    - සම්ප්‍රදායන් හඳුනා ගැනීම හා ගරු කිරීම
    - සම්ප්‍රදායන් රැකගත යුතු බව

උදාහරණ :- තම පාසලේ උදෑසන රැස්වීම සම්බන්ධ සම්ප්‍රදායන්

- ක්‍රීඩා උත්සව/ ත්‍යාග ප්‍රදානෝත්සව ආදිය සම්බන්ධ සම්ප්‍රදායන්

( තම පාසලට සුවිශේෂී සම්ප්‍රදායන් හඳුනාගෙන ඒවාට අනුගත වීමේ වැදගත්කම පැහැදිලි කරන්න)

- සම්ප්‍රදායන් රැක ගැනීමේ වැදගත්කම
    - පාසලේ අනන්‍යතාව ආරක්ෂා වීම
    - අනාගත සිසු දරුවන්ට ඒවා පවරා දීම
    - පාසලේ අභිමානය ගොඩනැගීම
    - සිසුන් තුළ ශික්ෂණය ගොඩනැගීම
    - ආත්මාභිමානයෙන් යුතු පිරිසක් බිහි වීම
- පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත

- **පාසල් ගීතය**

පාසල් ගීතයක අවශ්‍යතාව

පාසල මාතෘත්වයෙන් සලකා බොහෝ පාසල් ගී නිර්මාණය වී තිබීම

පාසල් ගීතයේ අර්ථය පැහැදිලි කිරීම

ගායනා කරන අවස්ථා

ගයනා කරන අවස්ථාවල දී නිසි ගෞරව දැක්වීම

(පාසල් ගීතය ගායනා කිරීමට සිසුන්ට ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන්න)

- **පාසල් කොඩිය**

වර්ණ, සංකේතවලින් ප්‍රකාශවන දේ

කොඩිය ඔසවන අවස්ථා

නිවැරදි ව කොඩිය ඔසවන ආකාරය

ගෞරව කළ යුතු ආකාරය

ගෞරව කිරීමේ වැදගත්කම

( පාසල් කොඩිය නිසි පරිදි එසවීමට සිසුන්ට ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන්න)

- **පාසල් නිල ඇඳුම**

චාම් බව

ක්‍රමානුකූල බව

සමාන බව

පාසලේ අනන්‍යතාව නිල ඇඳුමෙන් හැඟවෙන බව

නිල ඇඳුමේ ගෞරවය රැකගත යුතු බව

- **පාසල් ලාංඡනය**

වර්ණ, සංකේතවලින් ප්‍රකාශවන දේ

භාවිත කරන අවස්ථා

උදාහරණ - පාසල් නිල ඇඳුම සමඟ
- පාසලෙන් නිකුත් කරන ලිපි ලේඛන ආදිය සමඟ
- පාසල් ලාංඡනයෙන් පාසලේ අයිතිය හැඟවෙන බව

- **ආදර්ශ පාඨය**

  එයින් කියැවෙන අදහස

  එය ජීවිතයට ආදර්ශයක් විය යුතු බව
- **පාසලේ දැක්ම**

  පාසලේ දැක්ම තුළින් කියැවෙන දේ
- **පාසලේ මෙහෙවර**

  දැක්මෙන් අර්ථ ගැන්වෙන දේ ඉටු කර ගැනීමට පාසලෙන් සිදු වන මෙහෙය
- පොදුවේ පාසල පිළිබඳ ඉදිරිපත් කර ඇති ප්‍රසිද්ධ විද්වත් අදහස්

**ගුණාත්මක යෙදවුම්**

පාසල් ගීතය පිටපත් කරන ලද පත්‍රිකා, පාසල් ලාංඡනය, පාසල් කොඩිය හා අවශ්‍ය අනෙකුත් දේ සුදුසු පරිදි සපයා ගන්න. හැකිනම් පාසලේ සංගීත ගුරුවරයෙකු සිටි නම් ඔහුගේ/ඇයගේ සහයෝගය ලබා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

එක් එක් පාඩමට අදාළ ව සිසුන් සාමූහික ව හා කේවල වශයෙන් ඉටු කරනු ලබන ක්‍රියාකාරකම් සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.1.6 පාසල් සමාජයේ සාමාජිකයෙකු ලෙස තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් ඒ හා බැඳුණු වගකීම් හා යුතුකම් ඉටු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 02**

**ඉගෙනුම් පල**

- පාසල තුළ සෑම ශිෂ්‍යයෙකුට ම සමාන අයිතිවාසිකම් හිමි වන බව පිළිගෙන අදහස් දක්වයි.
- පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් ඒ හා බැඳුණු යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- පාසල් සමාජයේ සාමාජිකයෙකු ලෙස සහජීවනයෙන් හා සමානාත්මතාවයෙන් යුතු ව කටයුතු කරයි.
- පාසලේ භෞතික පරිසරය ආරක්ෂා කර ගැනීමට කැපවීමෙන් යුතු ව දායක වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් **සකස් කර** ගන්න)

- පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් තමන්ට හිමිවන අයිතිවාසිකම්

උදාහරණ - ඉගෙනීමට ඇති අයිතිය
- ක්‍රීඩා සහ විනෝද කටයුතු සඳහා සහභාගි වීමට ඇති අයිතිය
- පුස්තකාලය පරිහරණය කිරීමට ඇති අයිතිය
- ආරක්ෂාවට ඇති අයිතිය
- තම දක්ෂතා වර්ධනය කර ගැනීමට ඇති අයිතිය

- එම අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර

උදාහරණ - නොමිලයේ අධ්‍යාපනය ලබා දීම
- නොමිලයේ පාසල් පොත්/ නිල ඇඳුම් සැපයීම
- පුස්තකාල හා විද්‍යාගාර පහසුකම් සැපයීම

- එම අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම්

උදාහරණ - විනීත ව හැසිරීම
- හොඳින් ඉගෙනීම
- තම දක්ෂතා වර්ධනය කර ගැනීම
- පාසල් උපකරණ ආරක්ෂා කිරීම
- පාසලේ නීතිරීති හා සම්ප්‍රදායන් ගරු කිරීම
- පාසලේ සෙසු සාමාජිකයන්ට ගරු කිරීම
- පාසලේ කීර්තිනාමයට හා ගෞරවයට හානි නොවන සේ හැසිරීම
- තම අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම
- සමානාත්මතාවයෙන් හා සහජීවනයෙන් කටයුතු කිරීම
- පාසලේ භෞතික පරිසරය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම

- පාසල් සමාජය විවිධත්වයෙන් යුක්ත බව

උදාහරණ :- ස්ත්‍රී/ පුරුෂ, ජනවර්ග, ආගම්, වයස් අනුව

- පාසල් සමාජය තුළ සෑම සිසුවෙකුට ම සමාන අයිතිවාසිකම් හිමිවන බව

**ගුණාත්මක යෙදවුම්**

ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට ලබා දීමට ප්‍රමාණවත් පරිදි සුදුසු කාර්ය පත්‍රිකා සකස් කර ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

සිසුන් අයිතිවාසිකම් හා යුතුකම් සම්බන්ධයෙන් දක්වන අදහස්, ආරක්ෂාවට, පැවැත්මට, සහභාගිත්වයට හා සංවර්ධනයට ඇති අයිතිය පිළිබඳ ක්‍රියාකරකම්වල දී දක්වන ප්‍රතිචාර සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.1.7 ගුරු සිසු යුතුකම් පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 01**

**ඉගෙනුම් පල**

- ශිෂ්‍යයින් විසින් ගුරුවරු වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් හඳුනා ගෙන ඒවාට අනුගත ව කටයුතු කරයි.
- ගුරුවරු විසින් ශිෂ්‍යයින් වෙනුවෙන් යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- සිසුන්, සිසුන් අතර යුතුකම් ඉටු කිරීමේ අගය විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ගුරුවරුන් හා ශිෂ්‍යයින් අතර අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් හා වගකීම් මැනවින් ඉටු වීම අධ්‍යාපන ක්‍රියාවලියේ සාර්ථකත්වයට බෙහෙවින් බලපාන බව මෙහි දී අවධාරණය කිරීම ඉතා වැදගත් වේ.
- ශිෂ්‍යයින් ගුරුවරුන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම්
    - ගුරුවරයා දුටු විට හුනස්නෙන් නැගී සිටීම
    - අවශ්‍ය අවස්ථාවල උදව් කිරීම
    - අවවාද අනුශාසනා පිළිගෙන කටයුතු කිරීම
    - ගුරුවරයා සමඟ මනා සම්බන්ධතාවයෙන් යුතු ව ඉතා හොඳින් ඉගෙනීමේ කටයුතුවල යෙදීම
    - ගුරුවරයාට අවනත වීම හා මැනවින් ඇහුම්කන් දීම
- ගුරුවරයා ශිෂ්‍යයින් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම්
    - විනීත දරුවන් ලෙස ශික්ෂණය ඇති කිරීම
    - මනාව ධාරණය කර ගත හැකි පරිදි තේරුම් ගැනීමට පහසු ලෙස ඉගැන්වීමේ කටයුතු සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම
    - උපදේශනය හා මාර්ගෝපදේශනය තුළින් නිසි මග පෙන්වීම
    - යහපත් සමාජ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය ශිල්පීය හා ශාස්ත්‍රීය දැනුම ලබා දීම
    - සිසුන් සමාජයට හඳුන්වා දීම
    - සිසුන්ට අවශ්‍ය රැකවරණය හා ආරක්ෂාව සැපයීම
- සිසුන්, සිසුන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් හා වගකීම්
    - සහයෝගයෙන් කටයුතු කිරීම
    - සෙසු අයගේ අයිතිවාසිකම් ගරු කිරීම
    - සමානාත්මතාවයෙන් යුතු ව කටයුතු කිරීම
    - නිවැරදි උපදෙස් හා මග පෙන්වීම් ලබා දීම
    - යහපත් ක්‍රියාකාරකම්වලට යොමු වීම
    - අවශ්‍ය අවස්ථාවල දී සහෝදර සිසුන්ට උදව් කිරීම
    - විශේෂ අවශ්‍යතා ඇති සිසුන් වේ නම් ඒ අයට උදව් කිරීම

**ගුණාත්මක යෙදවුම්**

මෙම පාඩම ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු / සිසු යුතුකම් පිළිබඳ ව පැහැදිලි කිරීමට සුදුසු සම්පත් පුද්ගලයකු යොදා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය**

ගුරු / සිසු යුතුකම් පිළිබඳ ව සිසුන්ගේ දැනුවත්භාවය හා ප්‍රතිචාර සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.1.8 පාසල හා සමාජය අතර සබඳතා විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 04**

**ඉගෙනුම් පල**

- පාසල හා සමාජය අතර පවත්නා අන්‍යෝන්‍ය සබඳතාවල ස්වරූපය විස්තර කරයි.
- පාසල හා සමාජය අතර සම්බන්ධතාව සමාජ සංවර්ධනයට උපකාරී වන අයුරු විස්තර කරයි.
- පාසල ආරක්ෂා කර ගැනීම සමාජ වගකීමක් මෙන් ම යුතුකමක් බව පැහැදිලි කරයි
- ළමා මිතුරු පාසල් සමාජයක් ගොඩනැගීම සඳහා ගුරු සිසු ප්‍රජා කාර්යභාරය පැහැදිලි කරයි

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් **සකස් කර** ගන්න)

- පාසල හා සමාජය අතර අන්‍යෝන්‍ය සබඳතාවක් පැවතීම

උදාහරණ - සමාජයේ යහපැවැත්මට අවශ්‍ය මග පෙන්වීම හා පුහුණුව පාසල තුළින් ලැබෙන බව
- සංස්කෘතිය පවරා දීමට විශාල මෙහෙවරක් පාසලෙන් සිදුවන බව

- පාසලෙන් සමාජයට සැපයෙන සේවා
- සමාජයෙන් පාසලට සැලසෙන සේවා

උදාහරණ :- - පාසලේ සංවර්ධන කටයුතුවලට සහාය වීම
- පාසල සතු දේපළ ආරක්ෂා කිරීම

- පාසල හා ප්‍රජාව අතර පවතින විවිධ සබඳතා
  - පාසල් සංවර්ධන සමිතිය මගින් ප්‍රජාව පාසලට සම්බන්ධ වීම
  - පාසල නගා සිටුවීමේ කමිටු මගින් පාසලේ සංවර්ධනයට ප්‍රජාව දායක වීම
  - ආදි ශිෂ්‍ය සමිති හා සුභපතන්නන් ලෙස පාසලේ අභිවෘද්ධියට දායක වීම
  - මහජන නියෝජිතයින්/ රාජ්‍ය ආයතන/ රාජ්‍ය නොවන සංවිධාන පාසලට උදව් උපකාර කිරීම
- එම සබඳතා පාසලේ හා සමාජයේ දියුණුවට යොදා ගන්නා ආකාරය.
- පාසලේ පැවැත්මට සමාජය අවශ්‍ය වීම හා සමාජයේ පැවැත්මට පාසල අවශ්‍ය වීම
- පාසල ආරක්ෂා කර ගැනීම සාමූහික වගකීමක් බව
- ළමා මිතුරු පාසල් සමාජයක් ගොඩ නැගීම සඳහා ගුරු, සිසු, ප්‍රජා කාර්යභාරය

**ගුණාත්මක යෙදවුම්**

පාසල හා සමාජය අතර සම්බන්ධතා දැක්වෙන විවිධ ආකාරයේ කාර්ය පත්‍රිකා, ළමා මිතුරු පාසල් පිළිබඳ විස්තර සහ සම්පත් පුද්ගලයින් ගුණාත්මක යෙදවුම් ලෙස යොදා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පාසල, පාසල හා සමාජය අතර සබඳතා, පාසල ආරක්ෂා කර ගැනීම , ළමා මිතුරු පාසල් පිළිබඳ ව සිසුන්ගේ ප්‍රතිචාර, සාකච්ඡා සඳහා සහභාගී වීම් හා ක්‍රියාකරකම්වල දී දක්වන ප්‍රගතිය ඇගයීමට ලක්කර ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## 6.2 අප ජීවත්වන ප්‍රදේශය

සෑම පුද්ගලයෙකු ම සමාජ සත්ත්වයෙකු වන බැවින් සමාජයෙන් වෙන් ව ජීවත් වීම පහසු නොවේ. එම නිසා පුද්ගලයා සමාජය තුළ ජීවත්වීමේ දී එයට අනුගත වීම වැදගත්වන අතර ම සමාජ විවිධත්වයට ගරු කිරීම ද අත්‍යවශ්‍ය වේ.

එමෙන් ම සෑම පුද්ගලයෙකු ම තමන් උපන් ප්‍රදේශයට සංවේදී ව කටයුතු කිරීම මෙන් ම එහි මානව හා භෞතික සම්පත් පිළිබඳ ව බැඳීමකින් යුතු ව කටයුතු කිරීම වැදගත් වේ. තමා ජීවත් වන ප්‍රදේශයේ පිහිටීම මෙන් ම සම්පත් අගය කරමින් ඒවා සංරක්ෂණය කර ගැනීම සඳහා අවශ්‍ය පෙලඹවීම ඇති කිරීම ද අගනේ ය. තම ප්‍රදේශවාසීන් සමඟ මෙන් ම සමස්ත පුරවැසියන් සමඟ සාමූහික ව සහ සහජීවනයෙන් යුතු ව කටයුතු කිරීමේ නිපුණතාව සෑම පුද්ගලයෙකු තුළ ම වර්ධනය කළ යුතු ය.

එබැවින් තමා ජීවත්වන ප්‍රදේශයේ මානව හා භෞතික සම්පත් හඳුනා ගැනීම, ඒවා පරිහරණය, සංරක්ෂණය, සාමූහික ව ජීවත් වීමේ වැදගත්කම, තම කටයුතු පහසු කර ගැනීම සඳහා උදවුවන පුද්ගලයන් හා ආයතන පිළිබඳ ව අධ්‍යයනය කිරීමට අවස්ථාව සැලසීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව**

- ප්‍රදේශයේ මානව හා භෞතික සම්පත් සමාජයේ යහපැවැත්මට දායක කර ගනියි

**නිපුණතා මට්ටම**

6.2.1 තමා ජීවත් වන ප්‍රදේශයේ සම්පත් අගය කරමින් ඒවා සංරක්ෂණය කිරීමට කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 07**

**ඉගෙනුම් පල**

- තම ප්‍රදේශයේ පිහිටීම පරිපාලන ඒකක ඇසුරින් පැහැදිලි කරයි.
- තම ප්‍රදේශයේ භෞතික සම්පත් හඳුනා ගෙන නම් කරයි.
- ප්‍රදේශයේ භෞතික සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීමේ හා සංරක්ෂණය කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- මානව සම්පත් සංවර්ධනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- තම ප්‍රදේශයේ පිහිටීම
  - පළාත - තමන් ජීවත්වන ප්‍රදේශයේ පිහිටීම පරිපාලන ඒකක ඇසුරින් අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න.
  - දිස්ත්‍රික්කය
  - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
  - ග්‍රාම නිලධාරි කොට්ඨාසය - නම / අංකය
  - පළාත් පාලන ආයතනය
  - ගමේ නම හා එම නම ලැබීමට විශේෂ හේතුවක් ඇත්නම් එය ( ජනප්‍රවාද ආදිය/ වෙනත් හේතු ඇසුරින්)
  - ප්‍රදේශය අයත් දිස්ත්‍රික්කයට යාබද දිස්ත්‍රික්ක හඳුනා ගැනීම
  - ප්‍රදේශයේ පිහිටා ඇති ඓතිහාසික ස්ථාන (නාමික වශයෙන් හඳුනා ගැනීම ප්‍රමාණවත් වේ)
  - ප්‍රදේශයේ පිහිටා ඇති ආගමික ස්ථාන

- අප ප්‍රදේශයේ සම්පත්

  මානව සම්පත්

  භෞතික සම්පත්

උදාහරණ :- ස්වාභාවික සම්පත් - වාතය/ජලය/පස/ඛනිජවර්ග/කඳු/දියඇලි/ගංගා/වනාන්තර/ ස්වාභාවික වෘක්ෂලතා /වන සතුන්

- ස්වාභාවික නොවන සම්පත් - ගොඩනැගිලි, ලී බඩු උපකරණ ආදිය.

- නූතන සමාජ, ආර්ථික අවශ්‍යතා අනුව ඒවා ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමේ වැදගත්කම

උදාහරණ :- දියඇලි, ජල විදුලි බලය නිෂ්පාදනය සඳහා යොදා ගැනීම

( පරිසරයට හානි නොවන අයුරින් යොදා ගැනීම, තම ප්‍රදේශයට අදාළ ව නිදසුන් ඉදිරිපත් කරන්න.)

- ප්‍රදේශයේ භෞතික සම්පත් සීමිත බැවින් ඒවා අරපිරිමැස්මෙන් භාවිත කිරීම හා සංරක්ෂණය කිරීම

  උදාහරණ :- ජලය අරපිරිමැස්මෙන් භාවිතය

- මානව සම්පත් හඳුනා ගැනීම
  - මිනිසාගේ බුද්ධිමය හැකියා සහ කායික හැකියා පදනම් කර ගෙන මානව සම්පත් බිහි වේ.

උදාහරණ :-

- බුද්ධිමය හැකියා
  - විද්‍යාඥයින්
  - දාර්ශනිකයින්
  - වෛද්‍යවරුන්
  - ඉංජිනේරුවරුන්
  - ගුරුවරුන්

- කායික හැකියා
  - ගොවියන්
  - වඩුවන්
  - පෙදරේරුවන්
  - කම්මල්කරුවන්
  - කම්කරුවන්

( සැ. යු. සාපේක්ෂ වශයෙන් වැඩිපුර වෙහෙස වන්නේ බුද්ධිමය හැකියා ද, කායික හැකියා ද යන්න සලකා බලා මෙම වර්ගීකරණය සිදු කර ඇත)

- එසේ වූවත් මෙම බුද්ධිමය සහ කායික හැකියා සහිත ශ්‍රමිකයින් දෙකොටස ම අප ජීවත්වන ප්‍රදේශයේ සංවර්ධනයට දායකවීම හා
- ප්‍රදේශයේ සම්පත් උපයෝගීකර ගෙන රටේ සංවර්ධනයට දායක වීම පුරවැසියෙකු වශයෙන් අපෙන් ඉටු විය යුතු යුතුකමක් බව පැහැදිලි කරන්න.

- මානව සම්පත් ගුණාත්මකභාවයෙන් වැඩි දියුණු කිරීම.
  - ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග

  උදාහරණ:- - පුහුණු පාඨමාලා ඇරඹීම
  - විවිධ දක්ෂතා වර්ධනය සඳහා ශිෂ්‍යත්ව ලබා දීම.
  - පුද්ගල ආකල්ප සංවර්ධනය

- ප්‍රදේශයේ ආර්ථික කටයුතු

තම ජීවිතය පවත්වා ගැනීම හා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ප්‍රදේශයේ ජනතාව විවිධ කටයුතුවල නිරත වේ. එම කටයුතු ආර්ථික කටයුතු ලෙස හැඳින්විය හැකි ය. ඒවා කෘෂිකාර්මික, කාර්මික හා සේවා වශයෙන් වර්ග කළ හැකි ය. මෙම ආර්ථික කටයුතු බොහෝ විට ප්‍රදේශයේ මානව හා භෞතික සම්පත් පදනම් කර ගෙන ගොඩ නැගී ඇත.

උදාහරණ:- කෘෂිකාර්මික

- වී වගාව, එළවළු වගාව, ධීවර කර්මාන්තය, සත්ත්ව පාලනය, වන වගාව

කාර්මික

- උළු, ගඩොල්, සීනි, ඇඟලුම්

සේවා

- අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය, සන්නිවේදනය

(• තමා ජීවත් වන ප්‍රදේශයේ ඇති ආර්ථික කටයුතු පිළිබඳ අධ්‍යයනය කිරීමට අවස්ථාව සලසා දෙන්න.)

**ගුණාත්මක යෙදවුම්**

චිත්‍ර, රූප සටහන්, ආදර්ශන, අවශ්‍ය පරිදි ගුණාත්මක යෙදවුම් ලෙස භාවිත කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

එක් එක් පාඩම් ඒකකය සඳහා සකස් කරගත් ක්‍රියාකාරකම් අනුසාරයෙන් සිසුන්ගේ ප්‍රතිචාර හා ප්‍රගතිය සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.2.2 ප්‍රදේශවාසීන් සමඟ සාමූහිකත්වයෙන් යුතු ව ජීවත් වීමට ඇති සූදානම ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 06**

**ඉගෙනුම් පල**

- ප්‍රදේශවාසීන් අතර සාමූහිකත්වය කැපී පෙනෙන අවස්ථා නම් කරයි.
- සාමූහික ව කටයුතු කිරීමේ වැදගත්කම අගය කරමින් අදහස් ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- ප්‍රදේශවාසීන් අතර සාමූහිකත්වය කැපී පෙනෙන අවස්ථා
- තම පවුලේ මෙන් ම තම ප්‍රදේශයේ දියුණුවට එහි සාමාජිකයන්ගේ එකමුතු බව හා ක්‍රියාශීලී සහයෝගය අවශ්‍ය වේ. ඈත අතීතයේ සිට ම අප රටේ ජනතාව නොයෙකුත් අවස්ථාවල එකමුතු වී කටයුතු කළ ආකාරය සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

උදාහරණ - වැව් නිර්මාණය
- දාගැබ්, කොවිල්, පල්ලි නිර්මාණය
- මංගල්‍ය/අවමංගල්‍ය අවස්ථා/ආගමික අවස්ථා/ගොවිතැන් කටයුතු/ දන්සල්/ කඨින පිංකම්/පෙරහැර අවස්ථා/ශ්‍රමදාන

- සාමූහික ව කටයුතු කිරීමෙන් අත්වන ප්‍රයෝජන
  - වැඩ කටයුතු පහසුවෙන් හා ඉක්මනින් කර ගත හැකි වීම
  - පුද්ගලයින් අතර සුහදත්වය ඇති කර ගත හැකි වීම
  - සමගිය හා සහෝදරත්වය වැඩි දියුණු වීම
  - පාරම්පරික සිරිත්විරිත් පවත්වා ගෙන යා හැකි වීම
  - මුදලින් කර ගත නොහැකි දේ සාමූහික ප්‍රයත්නයන්ගෙන් ඉටු කර ගත හැකි වීම
  - සාමූහික ව වැඩ කිරීමෙන් සතුට හා වින්දනය ලැබීම

**ගුණාත්මක යෙදවුම්**

එක් එක් පාඩම සඳහා සුදුසු චිත්‍ර, රූප සටහන්, පින්තූර, වීඩියෝ පට ආදිය සපයා ගත හැකි නම් ඒවා සුදුසු පරිදි යොදා ගන්න. එමෙන් ම මදුරු උවදුරු මැඩලීම, පරිසර අලංකරණය වැනි කටයුතු සඳහා සාමුහික ව සහභාගී වන අවස්ථාවන්ට සිසුන් යොමු කිරීමට කටයුතු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

එක් එක් පාඩමේ දී සිසුන් ක්‍රියාකාරී ව සහභාගී වීම, සාමුහික ක්‍රියාකාරකම් ඇගයීම, පොදු කටයුතු සඳහා දක්වන උනන්දුව ආදිය සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.2.3 විවිධ පුද්ගලයින් හා ආයතන, තම දෛනික දිවි පැවැත්මට අවශ්‍ය බව තේරුම් ගෙන කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 07**

**ඉගෙනුම් පල**

- සමාජ අවශ්‍යතා ඉටු කිරීම සඳහා සහාය වන විවිධ පුද්ගලයින් හා සංවිධාන නම් කරයි.
- අපට උදවු කරන ආයතනවලින් හා පුද්ගලයින්ගෙන් ඉටු වන සේවාවන් වෙන් වෙන් ව ලැයිස්තු ගත කරයි.
- ප්‍රදේශවාසීන් තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා පිහිටුවා ගෙන ඇති සමිති සමාගම් වලින් සිදුවන සේවා අගය කරමින් අදහස් දක්වයි.
- සේවා සපයන්නන්ගේ සහ සේවාලාභීන්ගේ යුතුකම් හා වගකීම් විස්තර කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- පුද්ගලයෙකුට සමාජයේ ජීවත් වීමේ දී තම අවශ්‍යතා බොහෝවිට තනි ව සපුරා ගැනීම අපහසු වන බව

  එසේ නොහැකි වීමට හේතු

උදාහරණ :- අවශ්‍යතා සංකීර්ණ වීම

- විවිධ පුද්ගලයින්ගේ සහ සංවිධානවල සහාය ඒ සඳහා අවශ්‍ය වීම
- විවිධ කාර්ය ඉටු කිරීමට පුද්ගලයින් හා සංවිධාන සමාජය තුළ බිහි වී තිබීම

උදාහරණ :- අන්‍යෝන්‍යාධාර සමිතිය

- අපට උදව් කරන්නන් හා ඉටු වන සේවා

උදාහරණ :- ග්‍රාම නිලධාරි - පදිංචි සහතික නිකුත් කිරීම
සමෘද්ධි නිලධාරි - සමෘද්ධි සහනාධාර ලබා දීම
පවුල් සෞඛ්‍ය නිලධාරිනිය - ගර්භනී මව්වරුන් සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම
මහජන සෞඛ්‍ය පරීක්ෂක - බෝවන හා බෝනොවන රෝග වැළැක්වීම සඳහා උපදෙස් ලබා දීම
තැපැල්කරු - ලිපි හා පාර්සල් බෙදා දීම
පොලිස් නිලධාරි - මහජන සාමය ආරක්‍ෂා කිරීම හා පවත්වාගෙන යාමට සහාය වීම

- අපට උදව් කරන ආයතන හා ඒවායෙන් ඉටු වන සේවා

උදාහරණ:- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ප්‍රදේශයේ පරිපාලන කටයුතු
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - දිස්ත්‍රික් පරිපාලන කටයුතු
පළාත් සභාව - පළාත් මට්ටමින් ආණ්ඩුවේ පාලන කටයුතු පහසු කිරීම
පළාත් පාලන ආයතන (මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා) - පොදු පහසුකම් ලබා දීම
පාසල - යහපත් පුරවැසියෙකු බිහි කිරීම
රෝහල - සෞඛ්‍ය පහසුකම් ලබා දීම
පොලීසිය - නීතිය හා සාමය ආරක්ෂා කිරීම

(ඉහත ආයතනවලින් සිදු වන විවිධ සේවා පිළිබඳ ව ද අධ්‍යයනය කිරීමට සලස්වන්න)

- ප්‍රදේශයේ සිද්ධස්ථාන, සමිති සමාගම්, ආයතන මගින් ඉටු වන සේවා

සිද්ධස්ථාන
- බෞද්ධාගමික - පන්සල
- හින්දු ආගමික - කෝවිල්
- ඉස්ලාම් ආගමික - මස්ජිද
- ක්‍රිස්තියානි/කතෝලික ආගමික - පල්ලි දේවස්ථාන

- මෙහි දී තම ප්‍රදේශය තුළ ඇති පන්සල්, කෝවිල්, පල්ලි හඳුනා ගැනීම

- සිද්ධස්ථානවලින් ඉටුවන සේවා
  - මිනිසාගේ ආධ්‍යාත්මික ගුණ වගාව වර්ධනය කිරීම

උදාහරණ
- හික්මීම, විනය ගරුක බව හා සදාචාර සම්පන්න කිරීම
- කරුණාව, දයාව, මෛත්‍රිය, ඉවසීම වැනි ගුණාංග වර්ධනය කිරීම
- සහෝදරත්වය වර්ධනය කිරීම
- අසල්වැසියන්ට උදව් කිරීම
- දහම් දැනුම ලබා දීම

- සමාජයේ ආගමික අවශ්‍යතා ඉටු කිරීම

උදාහරණ
- දානමය පිංකම්වල දී
- අවමංගල්‍ය කටයුතුවල දී
- මංගල්‍ය කටයුතුවල දී

- අවවාද අනුශාසනා ලබා දීම

උදාහරණ
- ගැටුම් අවස්ථාවල දී/ පවුල් ආරවුල්වල දී/ සමිති සමාගම් පවත්වාගෙන යාමේ දී

- ආගමික ආයතන හා සමාජය අතර යහපත් බැඳීමක් ඇති කර ගනිමින් සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම
- ප්‍රදේශයේ සමිති සමාගම්
  - ප්‍රදේශවාසීන්ගේ සමාජ, ආර්ථික, සංස්කෘතික, පාරිසරික ආදී විවිධ පොදු අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සමිති සමාගම් පිහිටුවා ගෙන ඇති බව.

උදාහරණ
- සමූපකාර සමිති, ගොවි සමිති, ධීවර සමිති, ග්‍රාම සංවර්ධන සමිති, බෞද්ධ සමිති, අවංගල්‍යාධාර සමිති, ක්‍රීඩා සමිති, ණය දෙන සමිති, සුභසාධක සමිති.

(තම ප්‍රදේශයට අදාළ ව ඉහත සඳහන් ආයතනවලින් ඉටු වන සේවා අධ්‍යයනය කිරීමට සිසුන් යොමු කරන්න)

- ප්‍රදේශයේ ඇති සමිති සමාගම්වලින් සිදු වන සේවා
  - ප්‍රදේශයේ ජනතාව අතර එකමුතු බව ඇති කිරීම
  - සමගිය ගොඩ නැංවීම
  - කාලය අර්ථවත් ව ගත කිරීමට හැකි වීම
  - පොදු ගැටලු සාමූහික ව විසඳා ගත හැකි වීම

• සේවා සපයන්නන්ගේ හා සේවා ලබන්නන්ගේ යුතුකම්

| සේවා සපයන්නන්ගේ යුතුකම් | සේවා ලබන්නන්ගේ යුතුකම් |
| --- | --- |
| 1. කලට වේලාවට සේවා සැපයීම | 1. උපරිම ප්‍රයෝජන ලබා ගැනීම |
| 2. කාර්යක්ෂම ව කටයුතු කිරීම | 2. සපයන්නන්ට සහාය දැක්වීම |
| 3. සේවාවක් ලෙස සලකා කටයුතු කිරීම | 3. සේවය අගය කිරීම |
| 4. අල්ලස් හා දූෂණයෙන් තොර වීම | 4. කලට වේලාවට තොරතුරු ලබා දීම |
| 5. සේවය පැහැර නොහැරීම | 5. සුහදශීලී ව කටයුතු කිරීම |
| 6. අපක්ෂපාතී වීම | |
| 7. සුහදශීලී ව කටයුතු කිරීම | |

**ගුණාත්මක යෙදවුම්**

ප්‍රදේශයේ අපට උදව් කරන විවිධ පුද්ගලයින් හා ආයතන සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා සුදුසු සම්පත් පුද්ගලයින්, පාඩම් සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු කාර්ය පත්‍රිකා යොදා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

සිසු ක්‍රියාකාරකම් සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

## 6.3 යහපත් පුරවැසියෙකු වශයෙන් ප්‍රගුණ කළ යුතු ගුණාංග

වර්තමානයේ සමාජය සංකීර්ණ වීමත් සමග විවිධ ගැටලු සමාජය තුළ ඉස්මතු වෙමින් පවතී.

පාසල තුළින් සමාජයට දායාද කරන අනාගත පුරවැසියා, මෙම අභියෝග ජය ගැනීමටත්, ඒවාට සාර්ථක ව මුහුණ දීමටත්, සමාජයේ සෙසු සාමාජිකයන් සමග සහයෝගයෙන් ජීවත් වීමටත් හැකි ආකල්ප හා කුසලතාවලින් පරිපූර්ණ අයෙකු විය යුතු ය.

මෙවන් යහපත් ආකල්ප හා කුසලතාවලින් පිරිපුන් පුද්ගලයෙකු බිහි කිරීමෙහිලා පුරවැසි අධ්‍යාපනය විෂයෙන් හා එම විෂය ඉගැන්වීමේ කටයුතු භාර ගුරුවරයාගෙන් ඉටු විය යුතු මෙහෙය ඉමහත් ය. මෙම ඒකකය යටතේ යහපත් පුරවැසියෙකු වශයෙන් ප්‍රගුණ කළ යුතු ඉතා වැදගත් ගුණාංග කිහිපයක් විෂය අන්තර්ගතයට ඇතුළත් කර ඇත.

වත්මන් අභියෝගයන්ට සාර්ථක ව මුහුණ දීමේ දී ස්වයං සුචරිතභාවය, නීතිගරුක බව, අවංක බව, සාධාරණත්වය, පරිසර හිතකාමී බව, ජාතික අභිමානය වැනි ගුණාංග සිසුන් තුළ වර්ධනය කිරීම වැදගත් වේ.

මෙම ගුණාංග වර්ධනය කර ගැනීම පුද්ගල සංවර්ධනයටත්, පොදුවේ සමාජ හා ජාතික සංවර්ධනයටත් හේතුවන ආකාරය අවධාරණය කරමින් ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් අවස්ථා මඟින් මෙම ගුණාංග චරිතායනය කිරීමට සැලැස්වීමත් මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

**නිපුණතාව**

- යහපත් ගුණාංගවලින් හෙබි සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට සූදානම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම**

6.3.1 ආචාරශීලී ව භාෂාව භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 02

**ඉගෙනුම් පල**

- ආචාරශීලී ව භාෂාව භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- ආචාරශීලී ව භාෂාව භාවිතයේ දී සැලකිලිමත් විය යුතු ගුණාංග ප්‍රදර්ශනය කරයි.
- අවස්ථාවෝචිත ව භාෂාව භාවිත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- සංවරශීලී ව, ප්‍රියමනාප ව හා නිවැරදි ව අන්‍යයන්ට ගෞරවයක් ඇති වන පරිදි භාෂාව භාවිත කිරීමේ වැදගත්කම
- ආචාරශීලී ව භාෂාව භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු
- ආකර්ෂණීය ලෙස භාෂාව භාවිත කිරීමේ වැදගත්කම
- අයහපත් වචන භාවිතය නිසා සිදු වන ආදීනව හඳුනා ගැනීම
- ස්ථානයට හා අවස්ථාවට අනුව භාෂාව හැසිරවීම
    - භාෂාව බුද්ධි ගෝචර ව භාවිත කිරීමේ වැදගත්කම
    - ආගමික ස්ථාන, නිවස, පාසල, පොදු ස්ථාන, මංගල / අවමංගල හා වෙනත් උත්සව අවස්ථා, වෙනත් විශේෂ අවස්ථා ආදියේ දී උචිත ආකාරයට බස හැසිරවීම

**ගුණාත්මක යෙදවුම්**

අචාරශිලී ව හා ස්ථානෝචිත ව බස හැසිරවීම සම්බන්ධයෙන් ප්‍රායෝගික පුහුණුවක් ලබා දීමට කේවල හා කණ්ඩායම් වශයෙන් සිසුන් යොදා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

විවිධ අවස්ථාවලට අනුරූප ව සිසුන්ට කතා කිරීමට සලස්වා ඒ අනුව ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.3.2 අන්මත ගරු කරමින් සාකච්ඡා මගින් සම්මුතිවලට එළඹෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02**

**ඉගෙනුම් පල**

- සන්නිවේදන කාර්යයේ දී සක්‍රිය ව සවන් දීමේ යෙදෙයි.
- අන්‍යමත ඉවසීමේ වාසි විස්තර කරයි.
- එදිනෙදා කටයුතුවල දී සාකච්ඡා මගින් සම්මුතිවලට එළඹෙයි.
- ඵලදායි සන්නිවේදනය මගින් යහපත් අන්තර් පුද්ගල සබඳතා ගොඩනගා ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

ප්‍රගුණ කළ යුතු සන්නිවේදන කුසලතා

- සක්‍රීය ව සවන් දීම
    - "සක්‍රීය සවන් දීම" කෙටියෙන් හඳුන්වන්න.
- සක්‍රීය සවන් දීම හා සවන් දීම අතර වෙනස පැහැදිලි කිරීම
- සක්‍රීය ව සවන් දීමේ වැදගත්කම හා එසේ නොවූ විට ඇතිවන ගැටලු හා අනර්ථකාරී තත්ත්ව හඳුනා ගැනීම
    - සමාජය සමග කටයුතු කිරීමේ දී අන්‍යමත ඉවසීම
- නිවැරදි අදහස්වලට ගරු කිරීම
    - අන්‍යයන්ට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම
    - නොගැළපෙන අදහස් ගැටුමකින් තොර ව සමනය කිරීම
    - අන්‍යමත ඉවසීමේ වැදගත්කම
    - යහපත් අන්තර් පුද්ගල සබඳතා ගොඩනගා ගැනීම සඳහා ඵලදායී ලෙස සන්නිවේදන කුසලතා ප්‍රගුණ කිරීමේ වැදගත්කම

**ගුණාත්මක යෙදවුම්**

සක්‍රීය සවන් දීම, අන්මත ඉවසීම හා සාකච්ඡා මගින් අන්තර් පුද්ගල සබඳතා ගොඩනගා ගැනීම පිළිබඳ ව ප්‍රායෝගික පුහුණුවක් ලැබෙන පරිදි සිසුන් යොදා ගනිමින් සන්නිවේදන කටයුතු ඵලදායි ව සිදු වන අයුරු පැහැදිලි කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

ක්‍රියාකාරකමට අදාළ ව සිසුන් අන්මත ඉවසීම, නොගැළපෙන අදහස් ගැටුමකින් තොර ව සමනය කර ගැනීම, යහපත් අන්තර් පුද්ගල සබඳතා ගොඩනගා ගැනීම, සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.3.3 මනා විනයකින් හා ශික්ෂණයකින් යුතු ව කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02**

**ඉගෙනුම් පල**

- විනය හා ශික්ෂණය ඇති කරවන පොදු ගුණාංග විස්තර කරයි.
- විනය හා ශික්ෂණය පුද්ගලයෙකුට තම ජීවිත කාලය පුරා ම පවත්වා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- එදිනෙදා ජීවිතයේ දී මනා විනයකින් හා ශික්ෂණයකින් යුතු ව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- විනය හා ශික්ෂණය යන්න හැඳින්වීම
- ශික්ෂණය ඇති කිරීම සඳහා ඉගෙනීම, ඉගැන්වීම හා පුහුණුව යන අංශ ප්‍රගුණ කළ යුතු වීම
- පුද්ගලයෙක් තම ජීවිත කාලය තුළ මනා විනයක් හා ශික්ෂණයක් පවත්වා ගෙන යාමේ වැදගත්කම
  - විනය හා ශික්ෂණය පුද්ගල සංවර්ධනයට හා සමාජ සංවර්ධනයට මහෝපකාරී වීම (සාමකාමී සමාජයක් බිහි වීම)
  - විනය හා ශික්ෂණය පවත්වා ගැනීම ජීවන පුරුද්දක් කරගත යුතු වීම

උදාහරණ :- පවුල තුළ
පාසල තුළ
මහා මාර්ගයේ දී
පොදු දේපළ පරිහරණයේ දී
සමාජයේ දී

**ගුණාත්මක යෙදවුම්**

විනය ගරුක කිරීම සඳහා පුහුණු කිරීම, භාවනාවලට යොමු කිරීම, ක්‍රීඩා කටයුතුවලින් සංයමයක් ඇති කිරීම, මහා මාර්ගයේ නිවැරදි ව ගමන් කිරීම, වැනි අවස්ථා ඇතුළත් රූප රාමු සහිත සුදුසු පින්තූර, චිත්‍ර ආදිය යොදා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

විනය හා ශික්ෂණය ඇති කිරීම පුද්ගල හා සමාජ සංවර්ධනයට හේතු වන ආකාරය පැහැදිලි කිරීම ඇගයීමට ලක්කරමින් තක්සේරුකරණයේ යෙදෙන්න.

**නිපුණතා මට්ටම**

6.3.4 සමාජයේ පවතින සරු දේ, සරු දේ ලෙස හඳුනා ගෙන පිළිගන්නා අතර නිසරු දේ නිසරු දේ ලෙස හඳුනා ගෙන ප්‍රතික්ෂේප කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 02

**ඉගෙනුම් පල**

- සමාජය තුළ ඇති සරු, නිසරු දේ වෙන් කර දක්වයි.
- සමාජයේ සරු දෙයට අනුගත ව කටයුතු කිරීමට සුදුසු ක්‍රම යෝජනා කරයි.
- සමාජයේ නිසරු දේ පිටු දකින ආකාරය පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- සමාජයේ ක්‍රියාත්මක වන සරු දේ හඳුනා ගැනීම

උදාහරණ :- අධ්‍යාපනයට යොමු වීම
කලණ මිතුරු ඇසුර
නිවැරදි සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම

- සමාජයේ යහපැවැත්මට අදාළ දේවල් සරු ලෙස පිළිගැනීම
- සමාජයේ ක්‍රියාත්මක වන නිසරු දේ හඳුනා ගෙන පිටු දැකීම
  - සමාජයේ පරිහානියට හේතු වන දේ නිසරු දේ ලෙස සලකමින් ප්‍රතික්ෂේප කිරීමට හුරු වීම

උදාහරණ :- තමන්ට නොගැළපෙන පුද්ගලයින් හා කණ්ඩායම් ඇසුරු නොකිරීම
දුම්වැටි හා මත් ද්‍රව්‍ය තරයේ ප්‍රතික්ෂේප කිරීම

**ගුණාත්මක යෙදවුම්**

සිසුන්ට සරු දේ, නිසරු දේ ඉතා පැහැදිලි ව වෙන් කර හඳුනා ගැනීම සඳහා සුදුසු සම්පත් පුද්ගලයෙකු මගින් දේශනයක් / සාකච්ඡාවක් කිරීමට සලස්වන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

සමාජයේ පවතින සරු දේවල් හා නිසරු දේවල් පිළිබඳ ව සාකච්ඡා කිරීමට සලස්වා නිසරු දේ ප්‍රතික්ෂේප කිරීමෙන් සිදු වන වාසි හා නිසරු දේ යොදා ගැනීමෙන් වන අයහපත් ප්‍රතිඵල පිළිබඳ ව සිසුන් දක්වන ප්‍රතිචාර සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.3.5 සමාජ සම්ප්‍රදායන් හා නීතිරීති ගරු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02**

**ඉගෙනුම් පල**

- නීතිරීති, සම්ප්‍රදායන් ගරු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- සමාජ සම්ප්‍රදායන් හා නීතිරීති අනුගමනය කිරීමට හුරුවක් ලබයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- සම්ප්‍රදාය හැඳින්වීම
- නීති හැඳින්වීම
- සෑම නීතියක් ම හා බැඳුණු දඬුවමක් පැවතීම
- නීතිරීති හා සම්ප්‍රදායන් ගරු කිරීමේ වැදගත්කම

**ගුණාත්මක යෙදවුම්**

නීතිරීති, සම්ප්‍රදායන් සටහන් කරන ලද කාඩ්පත්

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

සිසුන් නීතිරීති, සම්ප්‍රදායන් සහ ඒවාට ගරු කිරීමේ වැදගත්කම සම්බන්ධයෙන් දක්වන අදහස් හා දැනුවත්භාවය සැලකිල්ලට ගෙන සුදුසු නිර්ණායක යොදා ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.3.6 සම්පත් අරපිරිමැස්මෙන් පරිහරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02**

**ඉගෙනුම් පල**

- සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කළ යුතු බව පැහැදිලි කරයි.
- පාසල් ශිෂ්‍යයෙකු ලෙස සම්පත් නාස්තිය වැළැක්වීමේ ක්‍රමෝපා අනුගමනය කරයි.
- සම්පත් නාස්තිය වළක්වා ගැනීමෙන් ඇතිවන වාසි පෙළගස්වයි.
- ආසන්න පරිසරයේ සම්පත් නාස්තිය අවම කිරීමට දායක විය හැකි අවස්ථා පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- සම්පත් හැඳින්වීම
  - ස්වභාව ධර්මයෙන් ලැබුණු සම්පත්
    උදාහරණ:- හිරු එළිය, ජලය, වාතය, වනාන්තර, භූමිය, ඛනිජ සම්පත්
  - මිනිසා විසින් නිර්මාණය කළ සම්පත්
    උදාහරණ:- ගොඩනැගිලි හා ඉදිකිරීම්, වාරිමාර්ග, යානවාහන, ඩෙස්ක්, පුටු හා උපකරණ යනාදිය
- ඇතැම් සම්පත් ප්‍රයෝජනයට ගනිද්දී ක්ෂය වන බව
- සම්පත් ඒකාකාරී ව ව්‍යාප්ත වී නොතිබීම
- සම්පත් සීමිත නිසා අරපිරිමැස්මෙන් භාවිත කළ යුතු වීම
- තම උවමනාවන් ඉටුකර ගැනීමේ දී නාස්තිය අවම කර සම්පත් භාවිත කිරීම
- පාසල් ශිෂ්‍යයෙකු ලෙස සම්පත් නාස්තිය වළක්වා අරපිරිමැස්මට හා සකසුරුවමට හුරුවීම

උදාහරණ :- ජලය අරපිරිමැස්මෙන් භාවිත කිරීම
අනවශ්‍ය ලෙස විදුලිය භාවිතයෙන් වැළකීම

- සම්පත් නාස්තිය වැළැක්වීමේ වැදගත්කම
  - මුදල් ඉතිරි වීම
  - සම්පත් ඉතිරි වීම
  - පරිසර හානිය අවම වීම

**ගුණාත්මක යෙදවුම්**

මෙම පාඩම සඳහා සැලසුම් කිරීමේ දී ප්‍රායෝගික ව ම සිසුන්ට ඒවා අවබෝධ කරගත හැකි වන පරිදි සෘජු උදාහරණ සපයන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

සම්පත් අරපිරිමැස්මෙන් භාවිතයට ගැනීමේ වැදගත්කම පිළිබඳ ව කෙටි වාක්‍ය රචනයක් ලිවීමට සලස්වා ඒ ඔස්සේ ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.3.7 පොදු දේපළ වගකීමෙන් යුතු ව සුරකියි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 02**

**ඉගෙනුම් පල**

- පොදු දේපළ නිපදවීම හා නඩත්තුව සඳහා රජය විශාල වියදමක් දරන බව පිළිගනිමින් කරුණු පැහැදිලි කරයි.
- පොදු දේපළ සුරැකීමට ගත හැකි ක්‍රියා මාර්ග පැහැදිලි කරයි.
- පොදු දේපළ ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳ ප්‍රජාව දැනුවත් කරයි.
- පොදු දේපළ තම අවශ්‍යතා සඳහා ප්‍රයෝජනයට ගනිමින් ඒවා සුරකියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- පොදු දේපළ හැඳින්වීම
  උදාහරණ:- පාසලේ ඇති සම්පත්
  මහා මාර්ග, දුම්රිය, බස්රථ
- පොදු දේපළවල ලක්ෂණ
- පොදු දේපළ ගොඩ නැගීම හා නිපදවීම සඳහාත් ලාභ අපේක්ෂාවකින් තොර ව රජය විශාල වියදමක් දරන බව සිසුන්ගේ අවධානයට යොමු කරන්න.
- පොදු දේපළ සුරැකීම හා එහි වැදගත්කම
  - පොදු දේපළ ආරක්ෂාකර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග

**ගුණාත්මක යෙදවුම්**

පාඩම ක්‍රියාත්මක කිරීමට කලින් සිසුන්ට අදාළ පොදු දේපළ පිළිබඳ දැක්වෙන පින්තූර, චිත්‍ර ආදිය රැගෙන ඒමට සලස්වා ඒවා ගුණාත්මක යෙදවුම් ලෙස භාවිතයට ගනිමින් පාඩම ක්‍රියාත්මක කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

"පොදු දේපළ සුරැකීම සඳහා අපට කළ හැකි දේ" මැයෙන් කෙටි රචනයක් ලිවීමට හෝ කතාවක් කිරීමට සලස්වා ඒ ඔස්සේ ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.3.8 පරිසර සංරක්ෂණය මගින් තිරසර සංවර්ධනයට සක්‍රිය ව දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාවː** 03

**ඉගෙනුම් පල**

- තමා අවට පරිසරය සංරක්ෂණයට දායක විය හැකි ආකාර ප්‍රකාශ කරයි.
- පරිසර සංරක්ෂණයේ වැදගත්කම හා එයින් ඇතිවන වාසි විස්තර කරයි.
- තමා ද පරිසරයේ කොටසක් සේ සලකා ක්‍රියා කළ යුතු බවට අදහස් දක්වයි.
- පරිසර සම්පත් අනාගත පරපුරට ආරක්ෂා කර තැබීමේ වැදගත්කම පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- පරිසරය හැඳින්වීම
- පරිසරය අපගේ පැවැත්මට අත්‍යවශ්‍ය බව
- මිනිසා ද පරිසරයේ කොටසක් බව
- මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් භෞතික පරිසරයට සිදුවන හානි
- පරිසර සංරක්ෂණයේ වැදගත්කම හා අනාගත පරපුරට ආරක්ෂා කර දිය යුතු බව

**ගුණාත්මක යෙදවුම්**

මෙම පාඩම සිසුන්ට පරිසරය අත්විඳීමට හැකි වන පරිදි පරිසරය හා බද්ධ වෙමින් එළිමහනේ සිදු කරමින් අදාළ පරිසර සාධක ගුණාත්මක යෙදවුම් ලෙස භාවිත කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

'පරිසර සංරක්ෂණයේ' වැදගත්කම මැයෙන් බිත්ති පුවත්පතකට ලිපියක් ලිවීමට සැලැස්වීමෙන් හෝ වෙනත් උචිත ක්‍රියාකාරකම් මගින් සිසුන් ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**නිපුණතා මට්ටම**

6.3.9 දේශීයත්වය අභිමානයෙන් අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව: 03**

**ඉගෙනුම් පල**

- දේශීය සංස්කෘතික උරුමයන් පිළිබඳ විස්තර අභිමානයෙන් යුතු ව ඉදිරිපත් කරයි.
- දේශීය නිෂ්පාදන, දේශීය ව වැවෙන දේ පිළිබඳ තොරතුරු රැස් කරයි.
- දේශීය දේ අගය කරමින් අභිමානයෙන් ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.
- දේශීය උරුමයන් ආරක්ෂා කිරීමට දායක විය හැකි ආකාර පැහැදිලි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** (පහත සඳහන් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම් සැලසුම් සකස් කර ගන්න)

- දේශිය දේ හැඳින්වීම
- දේශීය සංස්කෘතිය
- දේශීය සම්පත්
- දේශීය නිෂ්පාදන
- දේශීයව වැවෙන දේ
- දේශීය තාක්ෂණය
- දේශීය දේ අගය කිරීමේ වැදගත්කම
- දේශීය දේ සුරැකීම

**ගුණාත්මක යෙදවුම්**

දේශිය සංස්කෘතික උරුම, දේශීය නිෂ්පාදන, දේශීය ව වැවෙන දේ, දේශීය උරුම ආදිය දැක්වෙන පින්තූර, චිත්‍ර මේ සඳහා සුදුසු පරිදි යොදා ගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

දේශීයත්වය අභිමානයෙන් අගය කිරීමේ වැදගත්කම පිළිබඳ ව සිසුන්ගේ දැනුවත්භාවය සැලකිල්ලට ගෙන ඇගයීම හා තක්සේරුකරණය සිදු කරන්න.

**විවිධ සහය**

| | |
|---|---|
| ඒ.එල්.එස්.පී. අතපත්තු | කළමනාකරණ සහකාර<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |
| සිමිස්කා සුසිකෝ ජයවර්ධන | කළමනාකරණ සහකාර<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

**පිටකවර නිර්මාණය**

| | |
|---|---|
| රවීන්ද්‍ර තේනුවර | කථිකාචාර්ය<br>සෞන්දර්ය දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |